ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு
Ministry of Fisheries, Aquatic and Ocean Resources

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report
2022









ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
இலங்கை தேசிய நீரியல் வாழ் செய்கை அபிவிருத்தி அதிகார சபை
National Aquaculture Development Authority of Sri Lanka

වාර්ෂික වාර්තාව

2022

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

41/1, නව පාර්ලිමේන්තු පාර,

පැලවත්ත,

බත්තරමුල්ල.

දුරකථන අංකය: 011 2786495

ෆැක්ස් අංකය: 011 2786493

වෙබ් අඩවිය: www.naqda.gov.lk

පටුන

1	ආයතනික තොරතුරු	3
2	සභාපතිතුමාගේ සමාලෝචනය	5
3	තිරසාර සංවර්ධනයට අනුකූල වීම	16
4	අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	18
5	විගණකාධිපතිගේ වාර්තාව	44
6	වාර්ෂික ගිණුම් සහිත ශේෂ පත්‍රය	56

ආයතනික තොරතුරු

ආයතනයේ නම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

දැක්ම

ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය සහ කළමනාකාරීත්වය තුළින් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහ ජීවන තත්ත්වය උසස් කිරීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත් වීම.

මෙහෙවර

කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණ ජලජීවී ව්‍යවසායයන් සංවර්ධනය දිරිමත් කිරීම හා චිරස්ථායී ලෙස ජලජ සම්පත් කළමනාකරණය තුළින් මිරිදිය හා කිවුල්දිය මසුන් සුලභ කිරීමට පහසුකම් සැලසීමෙන් ග්‍රාමීය සමාජයේ දුප්පත්කම තුරන් කිරීම සහ සමාජ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීමට දායක වීම.

අධ්‍යක්ෂ මණ්ඩලය

2006 අංක 23 දරන පනතින් සංශෝධිත 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව පාලක මණ්ඩලය පත් කළ සාමාජිකයින් පස් දෙනෙකුගෙන් (05) හා නිල බලයෙන් පත් වූ සාමාජිකයින් අට දෙනෙකුගෙන් (08) සමන්විත වේ. පහත සඳහන් සාමාජිකයින් 2022 වර්ෂය තුළ පාලක මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් සේවය කළ අතර, වසර තුළ රැස්වීම් දොළහක් (12) පවත්වා ඇත.

<u>අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්</u>

පාලක මණ්ඩලයේ සාමාජිකයින් -2022			
අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද සාමාජිකයින්			
නම		තනතුර	සේවා කාලය
01	ජයන්ත විජේරත්න මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සභාපති	24/01/2020 - 31/12/2022
02	බී.ජී.එල්.යූ.බාලසූරිය මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	04/05/2021 - 31/12/2023
03	ජී.රාජ්කුමාර් මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	10/08/2022 - 31/12/2022
04	විපුල අබේරත්න මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	02/02/2020 - 31/ 12/2022
05	තුසිත විජේසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	28/02/2020 - 31/12/2022
නිල වශයෙන් පත් කරන ලද සාමාජිකයින්			
06	එස්.ජේ.කහවත්ත මහතා	නිල වශයෙන් පත් කර ඇති සාමාජික	02/07/2019 - 31/12/2022
07	මහාචාර්ය එම්.ජේ.එස්.විජයරත්න මහතා	නිල වශයෙන් පත් කර ඇති සාමාජික	10/02/2022 - 31/12/2022
08	ටෙෆාන් අබේසිංහ මහතා	නිල වශයෙන් පත් කර ඇති සාමාජික	23/09/2021 – 27/09/2022
09	පී.එච්.හඳුන්හේවා මිය	නිල වශයෙන් පත් කර ඇති සාමාජික	12/02/2020 - 31/12/2022
10	ටී.ඒ.ඩී.ධම්මික ප්‍රේමරත්න මහතා	නිල වශයෙන් පත් කර ඇති සාමාජික	04/03/2022 - 31/12/2022
11	ආර්.ඩී. චිත්‍රා නයනා මිය	නිල වශයෙන් පත් කර ඇති සාමාජික	25/03/2021 - 12/01/2022

ප්‍රධාන කාර්යාලය

41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල

විගණක

විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවෝ

මහජන බැංකුව, බත්තරමුල්ල

ලංකා බැංකුව, පැලවත්ත

සභාපතිතුමාගේ සමාලෝචනය

2022 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 2022 ජනවාරි මස 01 දින සිට ආරම්භ වූ මාස 12ක කාලසීමාව තුළ පසුගිය වර්ෂවල මෙන් ම කාර්යය සාධනයෙහි දියුණුවක් පෙන්නුම් කරන ලදි.

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය

වගුව 1 - පසුගිය වර්ෂවල මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය

වර්ෂය	මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය (මෙ.ටොං.)	වෙරළබඩ ජලජීවී වගාව හා ඉස්සන් නිෂ්පාදනය (මෙ.ටොං.)	මුළු නිෂ්පාදනය (මෙ.ටොං.)	පසුගිය වසරට වඩා නිෂ්පාදනයෙහි ඉහළ යාම ප්‍රතිශතයක් ලෙස (%)
2015	60,210	7,090	67,300	-11.2
2016	67,900	6,030	73,930	10
2017	76,953	5,587	82,540	12
2018	73,910	14,100	88,010	7
2019	77,340	13,240	90,580	3
2020	89,520	12,700	102,220	13
2021	85,560	18,890	104,450	2
2022	100,930	15,960	116,890	12

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

2022 වර්ෂයේ මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය මෙ.ටොන් 116,890 ක් වූ අතර එය 2021 වසරට වඩා මෙ.ටොන් 12,440 වැඩිවීමකි. 2021 ට සාපේක්ෂව මිරිදිය ජලාශවල වගා පාදක ධීවර කර්මාන්තයෙන් හා මිරිදිය ජලජීවී වගාව ආශ්‍රිතව මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටොන් 100,930 දක්වා 18% කින් ඉහළ ගොස් ඇත. මිරිදිය හා ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසු කීටයන් ජලාශ වල තැන්පත් කිරීම, ප්‍රජා සහභාගීත්වයෙන් ජලාශ කළමනාකරණය, මත්ස්‍ය බීජ නිෂ්පාදනය වැඩිකිරීම ආදී පියවර රැසක් ගන්නා ලදි. නමුත් 2022 වසරේ මුහුණදුන් බලශක්ති අර්බුදය හේතුවෙන් කිවුල්දිය ඉස්සන් නිෂ්පාදනය මෙ.ටොන් 14,080 දක්වා 2% කින් අඩු වී ඇත. පසුගිය වර්ෂවල මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය වගුව 1 හි දක්වා ඇත.

විදේශ විනිමය ඉපයීම හා ග්‍රාමීය ආර්ථිකය සඳහා දායකත්වය

2022 වසරේ මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදන වටිනාකම රු. බිලියන 79 ක් පමණ ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එමඟින් ග්‍රාමීය ආර්ථිකයට මහඟු දායකත්වයක් දක්වා ඇත. තව ද වගා කරන ලද ඉස්සන් අපනයනය තුළින් රු. මිලියන 13,175 ක විදේශ විනිමයක් උපයා ඇති අතර මෙය 2021 වසරේ රු. මිලියන 8,462 හා සසඳන කල 56% වැඩිවීමකි. විසිතුරු මත්ස්‍ය අපනයනය තුළින් රු. මිලියන 7,143 ක විදේශ විනිමයක් උපයා ඇති අතර මෙය 2021 වසරේ රු. මිලියන 2,409 හා සසඳන කල 74% වැඩිවීමකි. *(මූලාශ්‍ර: www.fisheries.gov.lk සහ නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය)*

මත්ස්‍ය බීජ නිෂ්පාදනය හා බෙදා හැරීම

2022 වසරේ දී උඩවලව, දඹුල්ල, ඉහිණියාගල, කලාවැව, ඉරණමඩුව, පොලොන්නරුව, නුවරඑළිය සහ මුරුතවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇසිත්තන් සංඛ්‍යාව මිලියන 230.38 කි. විදුලිය කප්පාදුව, ප්‍රමාණවත් භූමිතෙල් සැපයුමක් නොමැතිකම සහ විශේෂයෙන්ම අභිජනන කටයුතුවලට අදාළව ආහාර ආනයන සීමාකිරීම් හේතුවෙන් ඇති වූ බාධා නිසා 2021 වසරට සාපේක්ෂව මත්ස්‍ය ඇසිත්තන් නිෂ්පාදනය 4% කින් අඩු වී ඇත. මෙම ඇසිත්තන්ගෙන් වැඩි ප්‍රමාණයක් මත්ස්‍ය ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම සඳහා පෞද්ගලික පොකුණු, කූඩු, කොටු සහ ප්‍රජා පාදක සංවිධාන විසින් කළමනාකරණය කරන මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සඳහා නිකුත් කර ඇත. ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වලින් මත්ස්‍ය ඇසිත්තන් නිකුත් කිරීම 2021 ට සාපේක්ෂව 2022 දී මිලියන 135.50 දක්වා 7% කින් වැඩි විය. 2017 සිට 2022 දක්වා මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය සහ බෙදාහැරීම වගුව 2 හි දක්වා ඇත.

වගුව *2* - ඇසිත්තන් නිෂ්පාදනය සහ බෙදාහැරීම (මිලියන)

නිෂ්පාදන ඒකක	2017	2018	2019	2020	2021	2022
ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක සඳහා	19.13	26.35	20.43	14.60	31.05	35.60
ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවල ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා	60.82	79.02	57.85	100.03	113.11	81.22
පෞද්ගලික පොකුණුහිමියන් සඳහා	6.63	16.89	23.73	23.40	36.59	60.43
කූඩු / කොටු සඳහා	47.20	60.26	42.31	47.60	59.01	53.13
එකතුව	**133.78**	**182.52**	**144.32**	**185.63**	**239.76**	**230.38**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය

2022 වර්ෂය තුළ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක, කූඩු, කොටු හා පෞද්ගලික පොකුණු වල මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 145.43 ක් නිපදවන ලදි. 2021 ට සාපේක්ෂව මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය 30% කින් වැඩි වී ඇත. ඉහත සඳහන් මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනයෙන් 33%ක් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මගින් ද ඉතිරිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මගින් නිකුත් කළ ඇසිත්තන් පෞද්ගලික පොකුණු, කූඩු, කොටු සහ ප්‍රජා පාදක සංවිධාන විසින් කළමනාකරණය කරන මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක තුළ වර්ධනය කිරීමෙන් ලබා ගෙන ඇත. 2017 - 2022 කාලපරිච්ඡේදය තුළ විවිධ නිෂ්පාදන ඒකකවල සම්පූර්ණ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය වගුව 3 හි පෙන්වා ඇත.

වගුව **3** - මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය (මිලියන)

නිෂ්පාදන ඒකක	2017	2018	2019	2020	2021	2022
ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය නිෂ්පාදන ඒකක	13.38	16.74	15.03	12.07	17.23	20.90
ජලාශ්‍රිත මූලික කුඩා පරිමාණ මත්ස්‍ය නිෂ්පාදන ඒකක	-	0.46	0.04	0.42	0.22	0.36
ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල ඇඟිල්ලන් නිෂ්පාදනය	38.07	48.20	29.17	36.40	42.14	47.71
පෞද්ගලික පොකුණු හිමියන්	3.31	7.44	14.26	15.14	26.75	47.00
කූඩු / කොටු	28.16	38.79	30.09	31.91	25.24	29.46
එකතුව	**82.92**	**111.63**	**88.59**	**95.94**	**111.58**	**145.43**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, පෞද්ගලික පොකුණු, ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, කොටු සහ කූඩු මඟින් 2022 වසරෙහි නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇඟිල්ලන් ජලාශවල තැන්පත් කිරීම පිළිබඳ විස්තර වගුව 4හි දක්වා ඇත. 2022 වසර තුළ වැඩි මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණයක් තැන්පත් කිරීම තුළින් 2023 වසරේ මිරිදිය ධීවර හා ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීමට ඉවහල් වේ.

වගුව 4 - මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම - 2022

ජලාශ වර්ගය	ජලාශ සංඛ්‍යාව	මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම (මිලියන)
විශාල පරිමාණ ජලාශ	40	44.81
මධ්‍යම පරිමාණ ජලාශ	82	33.77
කුඩා පරිමාණ ජලාශ	348	43.20
කාලීන ජලාශ	971	17.21
පොකුණු / කූඩු / කොටු	376	2.95
ගංඟා සහ කළපු	-	2.62
එකතුව	**1817**	**144.56**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

දැනට පවතින ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල අභිජනන පහසුකම්, මත්ස්‍ය බීජ වර්ධක පහසුකම් සහ යටිතල පහසුකම් පුළුල් කිරීම, මිරිදිය මත්ස්‍ය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමට ඉවහල් වේ. මේ වන විට බොහොමයක් කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මඟින් ලබා ගන්නා මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සතු ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වලින් පමණක් මත්ස්‍ය බීජ සඳහා ඇති ඉල්ලුම සපුරාලීම දුෂ්කර බැවින් තෝරා ගත් කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක 10ක් මත්ස්‍ය පසු කීටයන් අවධියේ සිට ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම සඳහා වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත. ජලාශ වල තැන්පත් කිරීමට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් සැපයුම ඉහළ නැංවීම සඳහා මත්ස්‍ය අභිජනන තාක්ෂණය ධීවර ප්‍රජාවට හඳුන්වා දීමට සැලසුම් කර ඇත. ඒ අනුව අම්පාර එක්ගල් ඔය මත්ස්‍ය අභිජනන ඒකකයේ ඉදිකිරීම් අවසන් කර ඇත.

මිරිදිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය

පම්බල, කල්ලරාව හා කහඳමෝදර පිහිටි අභිජනනාගාර සහ පෞද්ගලික අභිජනනාගාරය මඟින් 2022 වසර තුළ මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 47.70ක් නිපදවන ලද අතර අදාළ වර්ෂය තුළ දී තැන්පත් කිරීම් පහත දක්වා ඇත. කෙසේ වෙතත්, ආථිමියා ආනයන සීමා කිරීම්, විදුලිය කප්පාදුව, ප්‍රමාණවත් භූමිතෙල් සැපයුමක් නොමැතිකම හේතුවෙන් අභිජනනාගාරවල මිරිදිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම 2021 ට සාපේක්ෂව 9% කින් අඩු වී ඇත. 2022 වසරේ ජලාශ වර්ගය අනුව මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම් වගුව 5හි දක්වා ඇත.

වගුව 5 - **මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම - 2022**

ජලාශ වර්ගය	ජලාශ සංඛ්‍යාව	තැන්පත් කරන ලද පසු කීටයන් (මිලියන)
විශාල පරිමාණ ජලාශ	21	16.70
මධ්‍යම පරිමාණ ජලාශ	46	19.60
කුඩා පරිමාණ ජලාශ	80	10.10
කාලීන ජලාශ	1	0.01
පොකුණු	9	0.18
කළපු	10	1.20
එකතුව	**167**	**47.70**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

2022 වසර තුළ මෙ. ටොන් 680 ක අස්වැන්නක් ලබා ගෙන ඇති අතර මිරිදිය ඉස්සන් වැඩි වටිනාකමක් ඇති විශේෂයක් බැවින් ධීවරයන්ගේ ආදායම් ඉහළ යයි.

නොමිලයේ මත්ස්‍ය / ඉස්සන් පැටවුන් නිකුත් කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ මත්ස්‍ය ඇසිත්තන් මිලියන 55.82, මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 99.04 සහ මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 33.22 ක් 2022 වසර තුළ ජලාශවල හා කුඩුවල නොමිලේ තැන්පත් කර ඇත.

ජලාශවල ධීවර කළමනාකරණ කටයුතු

නීත්‍යානුකූල නොවන ධීවර ආම්පන්න භාවිතය වළක්වා ජලාශවල මිරිදිය ධීවර කටයුතු නියාමනය සහ කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය සහ මිරිදිය ධීවර සමිති එක්ව වැටලීම් කරන ලද අතර මීට අමතරව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, දැනට පවතින ග්‍රාමීය ධීවර සංවිධාන ශක්තිමත් කිරීම ද සිදුකර ඇත. 2022 වර්ෂයේ දී මිරිදිය ධීවර යාත්‍රා 9,880ක් ක්‍රියාත්මක කර ඇති අතර මිරිදිය ධීවරයින් 55,372ක් ධීවර කටයුතුවල නිරත විය.

ඉස්සන් වගා කර්මාන්තය

ඉස්සන් වගාව ශ්‍රී ලංකාවේ වඩාත් ම ලාභදායී වාණිජ ජලජීවී වගාව වන අතර අධිකාරියෙහි අඛණ්ඩ නිරීක්ෂණ සහ අධීක්ෂණ කටයුතු හේතුවෙන් අද ඉස්සන් කර්මාන්තය ඵලදායී මට්ටමකට පැමිණ ඇත. ඉස්සන් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජල ප්‍රතිචක්‍රීකරණ ක්‍රමයක් හඳුන්වා දීම සහ වගා කරන ප්‍රදේශවල පෙව සුරක්ෂිතතාව ඉහළ නැංවීම තුළින් ඉස්සන් වගා ක්‍රියාකාරකම් තීව්‍ර කිරීම, ලන්දේසි ඇල හැරීම, පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් ගොවිපළ සඳහා පොදු විදුලිය සැපයීමට අධිකාරිය පියවර ගෙන ඇත. 2022 දී පැවති බලශක්ති අර්බුදය හේතුවෙන් 2021 ට සාපේක්ෂව 2022 දී මුළු ඉස්සන් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 14,080 දක්වා 2% කින් අඩු විය. කෙසේ වෙතත්, ඉහළම ඉස්සන් අපනයන ආදායම වන රු. මිලියන 13,174ක් 2022 වසරේ වාර්තා කළ අතර ඒ සඳහා ඉස්සන් මෙ.ටොන් 5,486ක් අපනයනය කර ඇත.

ජලජීවී වගා කළමනාකරණ බලපත්‍ර 320 ක් නිකුත් කරන ලද අතර මින් 292 ක් ඉස්සන් ගොවිපළ සඳහා ද 28 ක් ඉස්සන් අභිජනනාගාර සඳහා ද නිකුත් කරන ලදි. අධිකාරිය 2022 වසර තුළ ඉස්සන් පසු කීටයන් සහ මව් මත්ස්‍යයින්ගේ රෝග සඳහා PCR පරීක්ෂණ 4,055 ක් සිදුකර ඇති අතර මෙම පරීක්ෂණ බත්තුළුඔය ස්ථාපිත මත්ස්‍ය රෝග නිර්ණය සහ සෞඛය කළමනාකරණ විද්‍යාගාරය මගින් සිදු කරනු ලැබේ. මෙම පරීක්ෂණ, ගොවිපළ වල තැන්පත් කිරීම සඳහා නිරෝගී පසු කීටයන් අභිජනනය සඳහා ඉවහල් වේ. තව ද පසු කීටයන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා, සියලුම ඉස්සන් අභිජනනාගාර Monodon Bacula වෛරස් හා සුදු පුල්ලි රෝග සඳහා පරීක්ෂා කර කිවුල්දිය මත්ස්‍ය සෞඛ්‍ය සහ පාරිසරික අධීක්ෂණ විද්‍යාගාර නිලධාරීන් විසින් අධීක්ෂණය කරන ලදී.

2022 වසරෙහි දී පුත්තලම, මඩකලපුව, මන්නාරම දිස්ත්‍රික්කයන්හි ඉස්සන් අභිජනනාගාර 49 ක් සහ ඉස්සන් ගොවිපළ 901 ක් ක්‍රියාත්මක විය. අදාළ වර්ෂය තුළ *Peneaus monodon* පසු කීටයන් නිෂ්පාදනය මිලියන 86.50ක් හා *Litopeneaus vannamei* පසු කීටයන් නිෂ්පාදනය මිලියන 651.24 කි.

විසිතුරු මසුන් සහ ජලජ පැළෑටි වගාව

අධිකාරිය විසින් මසුන්ගේ නව ප්‍රභේද බිහිකිරීම, තාක්ෂණ සංවර්ධනය, මව් මසුන් සැපයීම, මත්ස්‍ය රෝග නිර්ණය, පුහුණුව සහ තාක්ෂණික උපදෙස් සැපයීම යනාදිය මඟින් විසිතුරු මසුන් හා ජලජ පැළෑටි වගාව මෙන් ම අපනයන සඳහා සහාය වෙනු ලබයි. රම්බඩගල්ල, ගිණිගත්හේන සහ සෙවනපිටිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන විසිතුරු මසුන් සහ ජලජ පැළෑටි වගාව සංවර්ධනයට අදාළ කාර්යයන් සඳහා වෙන් කර ඇත. ජානමය විවිධත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා රම්බඩගල්ල මධ්‍යස්ථානයේ ගප්පි ප්‍රභේද සහ ගිණිගත්හේන මධ්‍යස්ථානයේ ස්වෝඩ් ටේල් ප්‍රභේද වල ජාන ප්‍රවර්ධන වැඩසටහන් ආරම්භ කර ඇත. විසිතුරු ජලජ පැළෑටි පටක රෝපණය සඳහා රම්බඩගල්ල මධ්‍යස්ථානයේ පටක රෝපණ විද්‍යාගාරයක් පිහිටුවා ඇත. මෙහි මූලික අරමුණ වනුයේ තාක්ෂණික සහ ජලජ පැළෑටි අපනයනය තුළින් විදේශ විනිමය ඉපයීමය. 2022 වසරේ නිෂ්පාදිත ජලජ පැළෑටි සංඛ්‍යාව 29,791ක් විය.

මෙම මධ්‍යස්ථාන මඟින් විසිතුරු මසුන් මිලියන 4.09 ක් ගොවීන්ට හා අපනයනකරුවන්ට අලෙවි කර ඇත. මව් මසුන් 161,180 ක්ද මෙම වර්ෂය තුළ සපයා ඇත. මිරිදිය විසිතුරු මසුන් වඩාත් වර්ණවත් හා කැපී පෙනෙන ගප්පි, ස්වෝඩ්ටේල්, ප්ලේටි, බාර්බස්, ටෙට්ට්‍රා, ඒන්ජල්, ගුරමි සහ කැට්ෆිෂ් විශේෂ වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද මෙම මිරිදිය විශේෂ අතුරින් 50-60% පමණ ගප්පි වලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ නිත්‍ය අපනයන සමාගම් 45 ක් පමණ ඇත. 2022 දී ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් සඳහා ප්‍රධාන ගැනුම්කරුවන් වූයේ ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, චීනය, ජර්මනිය, කැනඩාව, එක්සත් ආරාබි එමීර් රාජ්‍යය, පෝලන්තය, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය සහ ජපානයයි. අදාළ වර්ෂය තුළ විසිතුරු මසුන් වගා ක්ෂේත්‍රයේ 1039 දෙනෙකු පුහුණු කර ඇත.

කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය, පුත්තලම, බංගදෙනිය

මේ වන විට ශ්‍රී ලංකාව කරදිය විසිතුරු මසුන් අපනයනය කරනුයේ මුහුදෙන් අල්ලාගෙන පමණි. මසුන් වැඩිපුර ඇල්ලීම, මසුන්ගේ වාසස්ථාන විනාශ වීම, කොරල් විනාශ වීම, මුහුදු පතුලේ රොන්මඩ තැන්පත් වීම, දූෂණය ආදී නොයෙකුත් පාරිසරික හේතූන් මත කරදිය විසිතුරු මත්ස්‍ය ගහනය අඩු වෙමින් පවතින අතර එම මසුන් සංරක්ෂණය සඳහා ඉදිරියේ දී කරදිය විසිතුරු මසුන් ඇල්ලීම සීමාකිරීමට කටයුතු කරනු ඇත. මෙය ශ්‍රී ලංකාවේ කරදිය විසිතුරු මසුන් අපනයනයට බලපානු ඇත. එම නිසා කෘත්‍රිමව අභිජනනය කර අපනයනය කිරීමට ඉදිරියේ දී සිදුවනු ඇත. මිරිදිය විසිතුරු මසුන් සමඟ සසඳන කල කරදිය විසිතුරු මසුන් සඳහා ඉතා ඉහළ මිලක් පවතින අතර විදේශ වෙළෙඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් ද පවතී.

විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන පරාසය වැඩිකිරීම, කරදිය විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම තුළින් අපනයන ආදායම වැඩිකිරීම, තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණු ඇතිව පුත්තලම බංගදෙනියෙහි කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය විසින් අභිලාෂය ප්‍රකාශ කිරීම් (EOI) කැඳවා සුදුසු ආයෝජකයෙකු තෝරා ගන්නා ලදී.

සම්ප්‍රදායික නොවන ජලජීවී වගාවන්

- **මුහුදු කූඩැල්ලන් අභිජනනය හා වගාව**

මුහුදු කූඩැල්ලන් වගාව ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අධිකාරිය විසින් අභිජනන මධ්‍යස්ථානයක් පවත්වා ගෙනයන අතර යාපනයේ එක් පුද්ගලික අභිජනනාගාරයක් ක්‍රියාත්මක වන අතර 2022 වසරේ දී පැටවුන් 113,300ක් නිෂ්පාදනය කර ඇත. මන්නාරම, කිලිනොච්චි සහ යාපනය යන ප්‍රදේශවල පෞද්ගලික අංශය විසින් මුහුදු කූඩැල්ලන් වගාව ක්‍රියාත්මක කරන අතර 2022 වසරේ දී මුහුදු කූඩැල්ලන් මෙ.ටොන් 563 (තෙත් බර) අස්වැන්නක් ලබා ගන්නා ලදී.

- **මුහුදු පැළෑටි වගාව**

උතුරු හා වයඹ පළාත් මුහුදේ මුහුදු පැළෑටි වගාව ප්‍රජා සහභාගිත්වයෙන් සිදු කරන අතර 2022 වසරේ මුහුදු පැළෑටි නිෂ්පාදනය මෙ. ටොන් 271 (තෙත් බර) කි. මුළු වගා වපසරිය හෙක්. 100ක් පමණි.

- **මොදා මත්ස්‍ය අභිජනනය සහ වගාව**

මීගමුව කළපුව, මන්නාරම, පුත්තලම, කිලිනොච්චි, මඩකළපුව හා යාපනය යන දිස්ත්‍රික්කවල මොදා මත්ස්‍ය වගාව සඳහා පුද්ගලික අංශය යොමු වී ඇත. 2022 වර්ෂයේ මොදා පැටවුන් මිලියන 2.27 තැන්පත් කර ඇති අතර මෙ.ටොන් 852 ක මොදා අස්වැන්නක් ලබා ගෙන ඇත.

මහා පරිමාණ කූඩු තුළ මොදා මත්ස්‍ය වගා ව්‍යාපෘතියක් පෞද්ගලික සමාගමක් විසින් ත්‍රිකුණාමල මුහුදේ ආරම්භ කරන ලදි. වානිජ මට්ටමින් මුහුදු ආශ්‍රිත මත්ස්‍ය වගාව රටට හඳුන්වාදීම මෙමගින් සිදුවේ. තවද මෙම ව්‍යාපෘතිය මගින් සෘජු රැකියා ඇතිකිරීම තුළින් වෙරළබඩ ජනතාවගේ ජීවනෝපාය ඇතිකිරීම, ස්වාභාවික මත්ස්‍ය ගහණය වෙත වන බලපෑම අවම වීම, නොකඩවා මත්ස්‍ය නිෂ්පාදනය අපනයන වෙළඳපළට සැපයීම මගින් විදේශ විනිමය වැඩි කිරීම, සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ගැනීම බලාපොරොත්තු වේ. 2022 වර්ෂයේ මෙ.ටොන් 406 ක මොදා අස්වැන්නක් ලබා ගෙන ඇත.

වෙරළබඩ ජලජීවී වගාව දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක අනෙකුත් සංවර්ධන කටයුතු

පහත සඳහන් කිවුල්දිය ජලජීවී වගා කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අභිලාෂ ප්‍රකාශ කැඳවා ඇති අතර (EOI) ඇගයීම් ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

- යාපනය හා කිළිනොච්චි දිස්ත්‍රික්ක වල මුහුදු කූඩැල්ලන් අපනයන ගම්මානයේ පොකුරු ක්‍රමයට මුහුදු කූඩැල්ලන් ගොවිපළවල් ක්‍රියාත්මක කිරීම.
- මන්නාරම, ඉලුප්පකඩවෙයි ජලජීවී වගා කලාපයේ ජලජීවී වගාව.
- හම්බන්තොට, ගල්මුල්ලහි හා මඩකළපුව, කොක්කඩිචෝලේහි ජලජීවී වගාව සඳහා වෙන් කර ඇති ප්‍රදේශයේ ජලජීවී වගාව.
- මඩකලපුව, මාර්න්කර්නිහි හෙක්ටයාර 950 ක ඉඩමක ජලජීවී වගාව.

- බංගදෙණිය අක්කර 65ක ඉඩමක ජලජීවී වගාව.
- මඩකලපුව දිස්ත්‍රික්කයේ ධර්මපුරම්හි පිහිටි බහු විශේෂ මුහුදු වරල් මත්ස්‍ය අභිජනනාගාරය ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම.
- පුත්තලම දිස්ත්‍රික්කයේ බංගදෙනියෙහි පිහිටි බහු විශේෂ මුහුදු වරල් මත්ස්‍ය අභිජනනාගාරය ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම.

තිරසර සංවර්ධනයට අනුකූල වීම

මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශය එහි සංවර්ධනය තුළින් තිරසර සංවර්ධන අරමුණු 1 දරිද්‍රතාවයෙන් තොර වීම, තිරසර සංවර්ධන අරමුණු 2 කුසගින්න තුරන් කිරීම, තිරසර සංවර්ධන අරමුණු 12 - වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය, තිරසර සංවර්ධන අරමුණු 14 - ජලජ තුළ ජීවය ඇතුළුව තිරසර සංවර්ධන අරමුණු කිහිපයක් සාක්ෂාත් කර ගැනීමට දායක විය හැකි අතර ඒවා ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා වගකිව යුතු අමාත්‍යාංශයේ සහ ආයතනවල කාර්යභාරය යටතේ සෘජුවම සම්බන්ධ වේ.

- තිරසර සංවර්ධන අරමුණු 1- දරිද්‍රතාවයෙන් තොර වීම - අධිකාරිය විසින් ජීවනෝපාය සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කර ඇති අතර 2022 දී මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශයේ නියැලී සිටින ධීවරයින් සහ වගාකරුවන් සංඛ්‍යාව 92,056 දක්වා ඉහළ ගොස් ඇත.

- තිරසර සංවර්ධන අරමුණු 2- කුසගින්න තුරන් කිරීම - අපගේ ඉලක්කය වන්නේ කුසගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසර ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම වන අතර මේ සඳහා මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වගා පාදක මිරිදිය ධීවර හා ජලජීවී වගාව සංවර්ධනය කිරීම සඳහා අධිකාරිය විසින් වැඩසටහන් ආරම්භ කර ඇත. 2022 වර්ෂයේ මිරිදිය මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 116,890 ක් වූ අතර එය 2021 වර්ෂයේ මෙට්‍රික් ටොන් 104,450 ක නිෂ්පාදනයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 12,440 ක වැඩි වීමකි.

- තිරසර සංවර්ධන අරමුණු 12 - වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය - ජලාශවල මත්ස්‍ය අස්වැන්න නැවුම් ලෙස ලබා ගත හැකි අතර මෙම මසුන් ජලාශ අවට හෝ ගම තුළ විකුණනු ලැබේ. ඉතිරි මත්ස්‍ය නිෂ්පාදනය නාගරික වෙළඳපල වෙත නැවුම් ආකාරයකින් පැමිණෙමින් පවතින අතර තව ද මෙම අතිරික්ත නිෂ්පාදනය ගම් මට්ටමින් කරවල සඳහා වේලීම සිදුකරයි. සියලුම ධීවරයින් සහ වගාකරුවන් බලපත්‍රයක් සහිත ව ක්‍රියාත්මක වේ. සෑම වැදගත් යහපත් කළමනාකරණ පිළිවෙතක් ම රෙගුලාසිවලට පරිවර්තනය කරන ලදී, සහ- කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දීම, වගකිව යුතු ධීවර කටයුතු සඳහා උදාහරණ වේ. එසේම සියලුම නව ජලජීවී වගා ව්‍යාපෘති පරිසර හිතකාමී ප්‍රවේශය භාවිතා

කරන අතර මෙය වගකිව යුතු වගාව සහතික කරනු ඇති අතර අවසානයේ වගකීමකින් නිෂ්පාදනයක් ඇති කරනු ඇත.

- තිරසර සංවර්ධන අරමුණු 14 - ජලය තුළ ජීවය - අධික උපයෝජනය, නීති විරෝධී හෝ අනවසර මසුන් ඇල්ලීම, ජල දූෂණය යනාදිය හේතුවෙන් කරදිය මත්ස්‍ය අස්වැන්න වැඩිකිරීමට අපහසු බැවින් වෙරළබඩ ප්‍රවණතාව වී ඇත්තේ සමුද්‍ර ජලජීවී වගාවයි. සමුද්‍ර ජලජීවී වගාව සඳහා පාරිසරික හිතකාමී ප්‍රවේශ වගාව ප්‍රවර්ධනය කිරීම හා වගා පද්ධති සඳහා පරිසර හිතකාමී ද්‍රව්‍ය යොදා ගනී. නොගැඹුරු මුහුදු ප්‍රදේශවල මුහුදු පැළෑටි වගාව ප්‍රවර්ධනය කරන අතර මුහුදු පැළෑටි මුහුදු ජලයේ CO_2 අවශෝෂණය කරයි. මෙය මුහුදු ජලයේ ආම්ලිකතාවය අඩු කිරීමට උපකාරී වේ. පාරිසරික හා කාර්මික ව තිරසර ආකාරයකින් දරා ගත හැකි ධාරිතාව සැලකිල්ලට ගනිමින් සමුද්‍රීය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා පුළුල් කිරීම කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, විගණනය කරන ලද ගිණුම් සහ විගණකාධිපති වාර්තා සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

1. හැඳින්වීම

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති ජලජීවී වගා අංශය 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත මඟින් 1999 ජනවාරි මස 29 වන දින පටන් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා - NAQDA) බවට පත් කරන ලදි. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හි ප්‍රධාන කාර්යාලය අංක. 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය සිදු කරනු ලබයි. අධිකාරිය ප්‍රධාන වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් යටතේ මිරිදිය ජලජීවී වගා සංවර්ධන, වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන, ව්‍යාප්ති, මූල්‍ය සහ මානව සම්පත් සංවර්ධන වශයෙන් අංශ 5කින් හා අධ්‍යක්ෂවරු පස් දෙනෙකුගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වේ.

මිරිදිය ජලජීවී වගා සංවර්ධනය

මිරිදිය ජලජීවී වගා සංවර්ධන අංශය විසින් කළමනාකරණය කරනු ලබන මිරිදිය ජලජීවී වගා මධ්‍යස්ථාන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂවරුන්, ස්ථාන භාර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර මත්ස්‍ය බීජ නිෂ්පාදනය සහ ජලාශ, පොකුණු, කූඩු සහ කොටු වල තැන්පත් කිරීමට වගාකරුවන් සඳහා අඛණ්ඩව මත්ස්‍ය බීජ සැපයුමක් පවත්වා ගෙන යාම මූලික වගකීම් වේ. මෙම අංශය විසින් කළමනාකරණය කරනු ලබන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන 10 ක් ඇත.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන (AQDCs)

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ප්‍රධාන මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන (AQDC) - දහයක් (10), මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන තුනක් (03), විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන තුනක් (03), බහු විශේෂ මුහුදු වරල් මත්ස්‍ය අභිජනනාගාරය සහ මුහුදු කූඩැල්ලන් අභිජනනාගාරය පහත ආකාරයට පවත්වා ගෙන යනු ලබයි.

<u>මධ්‍යස්ථාන</u>	<u>නිෂ්පාදන විශේෂයන්</u>
උඩවලව (කාප්)	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්
දඹුල්ල	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් සහ තිලාපියා
ඉහිණියාගල	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, තිලාපියා
නුවරඑළිය	සාමාන්‍ය කාපයා
උඩවලව (තිලාපියා)	තිලාපියා විශේෂ
ඉරණමඩුව	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්,තිලාපියා
මුරුතවෙල	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්, තිලාපියා
නව උඩවලව	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප්
කලාවැව	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, තිලාපියා
පොළොන්නරුව	සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, තිලාපියා
පම්බල	මිරිදිය ඉස්සන්
කහඳමෝදර	මිරිදිය ඉස්සන්
කල්ලරාව	මිරිදිය ඉස්සන්
රම්බඩගල්ල	විසිතුරු මසුන්
ගිනිගත්හේන	විසිතුරු මසුන්
සෙවනපිටිය	විසිතුරු මසුන්
ධර්මපුරම්	වරල් මසුන්
ඔලෙයිතුඩුවායි	මුහුදු කූඩැල්ලන්

ඉහත සඳහන් සියලුම මධ්‍යස්ථානවල සහකාර අධ්‍යක්ෂවරයකු හෝ ජලජීවී විද්‍යාඥවරයකු ස්ථාන භාර නිලධාරි වශයෙන් කටයුතු කරන අතර, ඔවුන්ගේ වගකීම

වන්නේ දිවයින පුරා පිහිටි ජලාශවල තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය බීජ නිෂ්පාදනය කිරීමයි.

ජලජීවී ව්‍යාප්ති සේවාව

ව්‍යාප්ති අංශය යටතේ කළාප භාර සහකාර අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකුගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල 22ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ (පළාත් හා දිස්ත්‍රික් මට්ටමින්). දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් විසින් ව්‍යාප්ති කටයුතු, රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කටයුතු , ජලජ සම්පත් කළමනාකරණය එනම් ජලාශවල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම, ධීවරයින් දැනුවත් කිරීමේ කටයුතු හා අනවසර ධීවර කටයුතු වැලැක්වීම සහ තාක්ෂණික උපදෙස් ලබා දීමේ කටයුතු සිදුකරනු ලැබේ.

වෙරළබඩ ජලජීවී වගා සංවර්ධනය

වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන අංශය යටතේ වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකක හතරක්, මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන තුනක්, විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන දෙකක් සහ විසිතුරු මත්ස්‍ය අභිජනන හා පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. මෙම සියලු මධ්‍යස්ථාන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂවරුන්, ස්ථාන භාර නිලධාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජලජීවී වගාව සහ විසිතුරු මත්ස්‍ය වගා සංවර්ධනය කිරීමේ වගකීම දරයි.

කලාවැව - ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු ආයතනය


මෙම ආයතනයේ ජලජීවී වගා අධිකාරියේ කාර්ය මණ්ඩලය, මිරිදිය ධීවරයන්, මසුන් වගා කරන්නන්, රාජ්‍ය නොවන ආයතන, ප්‍රජා මූලික සංවිධාන සහ උනන්දුවක් දක්වන පාර්ශව සඳහා මිරිදිය ධීවර සහ ජලජීවී වගා ක්ෂේත්‍රයට අදාළ පුහුණු වීම් පවත්වනු ලැබේ. තව ද රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැලැස්වීම ද සිදු කරනු ඇත.

සමාලෝචිත වර්ෂය තුළ සභාපතිවරයා ලෙස ජයන්ත විජේරත්න මහතා කටයුතු කළ අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ආචාර්ය ජේ.එම්. අශෝකා මහත්මිය කටයුතු කළ අතර 2022 වර්ෂය තුළ පහත සඳහන් නිලධාරීන් අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන ලදී.

ප්‍රධාන මෙහෙයුම් සහ උපකාරක සේවා අංශ / ඒකක

අංශය / ඒකකය	අංශ / ඒකක ප්‍රධානීගේ නම
මිරිදිය ජලජීවී වගා සංවර්ධන	එම්. වී. ධර්මදාස මහතා
වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන	එම්.ජී.ජී. ගුණසේන මහතා
ව්‍යාප්ති	ආර්. එච්. පොතුවිල මහතා
මානව සම්පත් සංවර්ධන	ඩබ්.එම්.අයි.කේ. විජේසේකර මහතා
මුල්‍ය	ඒ. එම්. එන්. එස්. බණ්ඩාරනායක මහතා
ඉංජිනේරු	එස්. ටී. විතානගේ මහතා
නීති	දිලූකා සුමනරත්න මහත්මිය
අභ්‍යන්තර විගණන	ජී.ඒ.ඩී.ඒ. පෙරේරා මහතා
සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ	කේ.එම්.ඩී.එම්. සෝමරත්න මහතා

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ආයතනික ව්‍යුහය



2. අරමුණු

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අරමුණ වන්නේ විධිමත් මහ පෙන්වීම තුළින් ජලජීවී වගා සංවර්ධනයට අවශ්‍ය රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ සහ සංවර්ධනයන්, පුහුණු කිරීම් හා ව්‍යාප්ති කටයුතු යනා දී ක්‍රමවේදයන් තුළින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගාවේ තිරසර සංවර්ධනයයි. මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම තුළින් ආර්ථික සංවර්ධනය, ජනගහනයේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම,අපනයන වෙළඳපොළට ඉහළ වටිනාකමක් සහිත මත්ස්‍ය විශේෂ ඉදිරිපත් කිරීම සහ රැකියා අවස්ථා බහුල කිරීමෙන් සහ ආදායම් තත්ත්වය ඉහළ දැමීම තුළින් දිළිඳුකම අඩුකිරීම නැක්ඩා ආයතනයේ අනෙකුත් අරමුණු වේ.

15/09/2011 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛන අංක 58(2) අනුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ප්‍රවර්ධන ආයතනයක් (Promotional Institute) ලෙස වර්ගීකරණය කර ඇත.

03. මානව සම්පත් තොරතුරු

2022 දෙසැම්බර් **31** දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මිනිස් බලය පිළිබඳ තොරතුරු

කාණ්ඩය	අනුමත සංඛ්‍යාව	සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ප්‍රධාන විධායක නිලධාරී	**01**	**01**	**-**
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	**05**	**02**	**03**
මධ්‍ය මට්ටමේ කළමනාකරුවන්	**28**	**25**	**03**
කණිෂ්ඨ මට්ටමේ කළමනාකරුවන්	**100**	**93**	**07**
ජලජීවී විද්‍යාඥයින්	69	68	01
ප්‍රාදේශීය/දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරින්	20	17	03
සංඛ්‍යාලේඛන නිලධාරින්	03	03	-
පරිසරක විශ්ලේෂක	01	01	-
මූල්‍ය නිලධාරි	01	01	-
සමාජ සංවර්ධන නිලධාරි	01	01	-
ප්‍රසම්පාදන නිලධාරි	01	01	-
පරිපාලන නිලධාරි	01	01	-
අභ්‍යන්තර විගණන නිලධාරි	01	-	01
විමර්ශන නිලධාරි	01	-	01
භාෂා පරිවර්තක	01	-	01
කළමනාකාර සහකාර - තාක්ෂණික	**141**	**133**	**08**
ජලජීවී වගා සහකාර	23	21	02

ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන්	110	108	02
කළමනාකාර සහකාර	03	-	03
තාක්ෂණික නිලධාරීන්	03	02	01
පොත් තබන්නන්	01	01	-
වැඩමූලික	01	01	-
කළමනාකාර සහකාර - තාක්ෂණික නොවන	**82**	**74**	**08**
ප්‍රාථමික මට්ටම	**436**	**365**	**71**
විදුලි/ යන්ත්‍ර කාර්මික	11	07	04
රියදුරු	54	50	04
රසායනාගාර සහායක	03	03	-
සංචාරක බංගලා භාරකරු	08	03	05
සුළු සේවකයින්	360	302	58
එකතුව	**793**	**693**	**100**

එසේම, ජලජීවී වගාව ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා 109 දෙනෙකුගේ (සුළු සේවකයින්) සේවය බාහිර ආයතනයක් හරහා ලබාගෙන ඇත.

බඳවාගැනීම්

	නම	පත්වීම් කාණ්ඩය	තනතුර	පත්වීම් දිනය
01	ටී.බී.අයි.කේ.ඊ දිසානායක මහතා	ස්ථිර	සංචාරක බංගලා භාරකරු	11-01-2022
02	පී.සී.අයි. පියරත්න මහතා	ස්ථිර	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)	21-01-2022
03	ඒ.ඒම්.ඒන්.ඒස්, බණ්ඩාරනායක මහතා	ස්ථිර	අධ්‍යක්ෂ (මුදල්)	07-03-2022
04	ජී.ඒ.ඩී.ඒ. පෙරේරා මහතා	ස්ථිර	අභ්‍යන්තර විගණක	08-04-2022

සේවයෙන් ඉවත් වීම්

	නම	පත්වීම් කාණ්ඩය	තනතුර	දිනය
01	එච්.එම්.යූ.කේ.පී.බී. හේරත් මහතා	ස්ථිර	අධ්‍යක්ෂ (මිරිදිය)	2022.04.01
02	එල්.එන්.එස්. පෙරේරා මිය	ස්ථිර	ප්‍රසම්පාදන නිලධාරි	2022.11.30
03	කේ.එච්.එම්.ආර්. කෙහෙල්ලැල් මහතා	ස්ථිර	කළමනාකාර සහකාර	2022.04.03
04	ජී.ජී.එල්. ඉන්දික මහතා	ස්ථිර	කළමනාකාර සහකාර	2022.10.04
05	යූ.ජී.එන්. ජයවීර මහතා	ස්ථිර	සුළු සේවක	2022.12.31
06	එච්.කේ. කීර්තිරත්න මහතා	ස්ථිර	සුළු සේවක	2022.11.14
07	එම්.පී.ජී.එල්. ප්‍රනාන්දු මහතා	ස්ථිර	සුළු සේවක	2022.12.10
08	බී.ඩබ්.එස්.ජේ. බණ්ඩාර මහතා	ස්ථිර	සුළු සේවක	2022
09	ඒ.ජී. උපතිස්ස මහතා	ස්ථිර	සුළු සේවක	2022.04.08
10	එච්.ඩී.ජී.ඩී.එන්. සමරවික්‍රම මහතා	ස්ථිර	සුළු සේවක	2022.01.26
11	වයි. යෙසුඩියන් මහතා	ස්ථිර	සුළු සේවක	2022.01.14

12	ඩබ්.එස්. ප්‍රියමාලි මිය	ස්ථිර	ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරි	2022.05.23
13	එස්. ප්‍රතීපන් මහතා	ස්ථිර	ජලජීවී විද්‍යාඥ	2022.12.06
14	එන්. ආර්. ක්‍රිශාන්ති මිය	ස්ථිර	සුළු සේවක	2022.10.17
15	පී.කේ. එස්. චතුරංග මහතා	ස්ථිර	සුළු සේවක	2022.11.25
16	එස්.ඩබ්. රණවීර මහතා	ස්ථිර	සුළු සේවක	2022.11.14
17	ඩී.ඊ. ජයනෙත්ති මහතා	ස්ථිර	ජලජීවී විද්‍යාඥ	2022.12.06
18	බී.ජී.ඩී.එස්. චන්ද්‍රරත්න මහතා	ස්ථිර	ජලජීවී විද්‍යාඥ	2022.12.31
19	එස්.ඒ.පී. කුමාර මහතා	කොන්ත්‍රාත්	විදුලි කාර්මික	15.10.2022
20	ඩී.එම්. සුමනසිංහ මහතා	කොන්ත්‍රාත්	සුළු සේවක	12.08.2022
21	අයි.ඒ.එච්.ඩී. ඉලෙපෙරුම මහතා	ස්ථිර	සුළු සේවක	2022.10
22	ජී.ඩබ්.ඒ.ඩී. මධුසංක මහතා	ස්ථිර	සුළු සේවක	23.05.2022
23	ආර්.ආර්.ජී.සී. ඩබ්. බණ්ඩා මහතා	කොන්ත්‍රාත්	සුළු සේවක	05.04.2022
24	පී.සී.අයි. පියරත්න මහතා	ස්ථිර	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)	19.10.2022

දේශීය පුහුණුවීම්

	නම සහ තනතුර	පුහුණු වැඩසටහන	ආයතනය	දිනය
01	කේ.ජී.ඩබ්. ප්‍රියදර්ශන මහතා, කළමනාකාර සහකාර	වැටුප් පරිවර්තනය	නිපුණතා සංවර්ධන අරමුදල	2022/08/26 2022/08/31
02	ඒ.ඒ.එම්.ඒන්.ඒස්, බණ්ඩාරනායක මහතා, අධ්‍යක්ෂ (මුදල්)	ලංසු බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ වැඩමුළුව	මහා භාණ්ඩාගාරය	2022/12/13 2022/12/14

විදේශීය පුහුණුවීම්

	නම සහ තනතුර	පුහුණු වැඩසටහන	පුහුණුව පැවති රට	කාලය
01	ආචාර්ය ජේ.එම්. අසෝකා මහත්මිය, අධ්‍යක්ෂ ජනරාල්	A scoping study to develop a plan for Sustainable Marine Aquaculture in Sri Lanka	ඕස්ට්‍රේලියා	01.06.2022 – 12.06.2022
02	බී. නිරුපරාජ් මහතා, සහකාර අධ්‍යක්ෂ (වෙරළබඩ)			
03	ඩබ්.ඩී.එල්. වල්පිට මහතා, ජලජීවී විද්‍යාඥ	Training workshop on best practices in sea cucumber seed production and seaweed tubular farming	ටැන්සානියා	07-11.2022 – 11.11.2022

4. <u>නඩු කටයුතු</u>

1. පවරා ඇති ආයතනය: වීරකෝන් ඉදිකිරීම් සමාගම**:** වැලිකන්ද ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් වීරකෝන් සමාගමට ලැබිය යුතු රුපියල් මිලියන 26 ක මුදලක් ලබා ගැනීමට පවරා ඇති බේරුම්කරණ නඩුවකි.

බේරුම්කරණයේදී මෙම මුදල වීරකෝන් සමාගමට ගෙවීමට තීරණය කළ ද අධිකාරිය මෙම තීරණයට විරුද්ධ වී ඇත. බේරුම්කරණයට යොමු කර ඇත.

2. පවරා ඇති නඩුව: වීරකෝන් කන්ස්ට්‍රක්ෂන් සමාගම, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට එරෙහිව විනිශ්චයට යොමු වූ අතර, විනිශ්චය අතරතුර, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මෙම සමාගමට රුපියල් මිලියන 15.5 ක මුදලක් ගෙවීමට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත නියෝග කරන ලදී.

3. ආර්.ඊ වීරකෝන් සමාගම එදිරිව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය: බැදුම්කරයේ අඩංගු මුදල ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ලැබීම වැළැක්වීම සඳහා පවරා ඇති නඩුව - නඩු අංකය : DSP 220/2020 - සෙවනපිටිය මධ්‍යස්ථානයේ ඉදිවෙමින් පවතින පොකුණු සම්බන්ධ නඩුව.

4. CHC/303/2021/MR- මුරුතවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ජලජීවී වගා පොකුණු ඉදිකිරීමේ බැදුම්කරයේ අඩංගු මුදල අධිකාරියට ලැබීම වළක්වාලමින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට එරෙහිව කිරුළ ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම විසින් ගොනු කරන ලද නඩුව.

5. සමාගම පවරා ඇති නඩුව: ෆයිනයිට් ලංකා (පුද්ගලික) සමාගම එදිරිව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ඔලෙයිතුඩායි ප්‍රදේශයේ මෙම සමාගම විසින් සිදු කරන ලද ඉදිකිරීම් ප්‍රමාණය අයකර ගැනීම සඳහා මෙම සමාගම විසින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති විනිශ්චයකි. එය විභාග වෙමින් පවතී. තීන්දුව 2023.03.24 දින ලබාදීමට නියමිතය.

6. සමාගම පවරා ඇති නඩුව: ෆයිනයිට් ලංකා (පුද්ගලික) සමාගම එදිරිව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය දෙපාර්ශවයේ ලිඛිත දේශන 2023.02.13 දිනට පෙර ලබා දිය යුතු බවට තීරණය විය.

7. බේරුම්කරණ ක්ෂේත්‍රය කිරුළ ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම : මුරුතවෙල මධ්‍යස්ථානයේ ඉතිරි ඉදිකිරීම් නිම කිරීම සඳහා කිරුළ ඉංජිනේරු සමාගම ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට එරෙහිව බේරුම්කරණ තීන්දුවට අනුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට එරෙහිව බේරුම්කරණයකට එළඹ ඇත. අධිකාරිය ට පක්ෂව සමථකරණය තීන්දු විය.

2020/2021 සහ 2022 වර්ෂවල අධිකාරිය විසින් පවරා ඇති නඩු:

1. CHC/1298/22/ARB පැවරුම්කරු: ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, වීරකෝන් සමාගම සහ ICLP බේරුම්කරණ මධ්‍යස්ථානය ඒ.සී. රාසයියා මහතා බේරුම්කරු වන අතර ඔහු ඉවත් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව නඩුවක් පවරා ඇත.

2. දඹුල්ල දිසා අධිකරණයේ නඩු අංක 2013 / එම්ආර් - මෙම නඩුව පවරන ලද්දේ අධිකාරියට අයත් අංක 253-3478 දරන වාහනයට හානි කළ ටිපර් රථ හිමිකරුගේ රක්ෂණ සමාගමෙන් අයකර ගැනීමටය, සිදුවූ හානිය හේතුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සියළුම මුදල් අයකර ගැනීමට නොහැකි විය.

3. AQDC වැලිකන්ද NAQDA ඉදිකිරීම සඳහා වීරකෝන් ඉදිකිරීම් සමාගමට රුපියල් මිලියන 26ක් ගෙවීමට සිදු විය. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය දැන් එයට එරෙහිව බේරුම්කරණයකට යොමු වී ඇත.

4. සෙවනපිටිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධ සමථකරණ නඩුවේ දී ආර්.ඊ. වීරකෝන් ඉදිකිරීම් සමාගමට ගෙවීමට සිදු වූ රුපියල් මිලියන 15.5ක මුදල ගෙවීමට එරෙහිව බේරුම්කරණ නඩුවක් පැවරීම.

5. <u>ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල වල ප්‍රගතිය</u>

මීරිදිය ජලජීවී වගා සංවර්ධන අංශයේ ප්‍රගතිය

වගුව 6 - ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල මත්ස්‍ය බීජ නිෂ්පාදනය

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථන	පසු කීටයන් නිෂ්පාදනය (මිලියන)	ඇසිත්තන් නිෂ්පාදනය (මිලියන)	ඇඟිල්ලන් නිෂ්පාදනය (මිලියන)
උඩවලව (කාප්)	66.48	25.68	5.22
උඩවලව (තිලාපියා)	-	13.47	2.37
නව උඩවලව	1.96	10.48	2.28
ඉඟිනියාගල	82.55	46.63	7.90
දඹුල්ල	64.52	43.18	5.91
ඉරණමඩු	2.55	16.53	5.48
මුරුතවෙල	28.04	16.34	4.25
නුවරඑළිය	3.79	1.59	0.53
සෙවනපිටිය	20.61	23.13	6.64

කලාවැව	35.00	33.36	7.16
එකතුව	**305.49**	**230.39**	**47.74**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

වගුව 7- ඇසිත්තන් හා ඇඟිල්ලන් නිකුත් කිරීම

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය	*ඇසිත්තන්* (මිලියන)	ඇඟිල්ලන් (මිලියන)
උඩවලව (කාප්)	16.58	5.22
උඩවලව (තිලාපියා)	8.36	2.37
නව උඩවලව	2.32	2.29
ඉඹිනියාගල	36.27	7.93
දඹුල්ල	39.79	5.89
ඉරණමඩු	7.70	5.55
මුරුතවෙල	7.83	4.17
නුවරඑළිය	0.49	0.53
සෙවනපිටිය	13.01	6.49
කලාවැව	16.80	6.45
එකතුව	**149.15**	**46.89**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන අංශයේ ප්‍රගතිය

*වගුව **8** - මිරිදිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය*

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය	*මිරිදිය ඉස්සන් පසු කීටයන්* (මිලියන)
කහඳමෝදර	18.98
පම්බල	4.67
කල්ලරාව	12.35
එකතුව	**36.00**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

*වගුව **9** - විසිතුරු මත්ස්‍ය,* ජලජ පැළෑටි නිෂ්පාදනය හා පුහුණුලාභීන්

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය	විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය (මිලියන)	ජලජ පැළෑටි නිෂ්පාදනය	පුහුණුලාභීන් සංඛ්‍යාව
රම්බඩගල්ල	0.64	28,491	1039
ගිනිගත්හේන	2.20	1300 (මිටි)	-
සෙවනපිටිය	1.25	-	-

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

*වගුව **10** - වෙරළබඩ ජලජීවී නිෂ්පාදනය*

වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති සහ අධීක්ෂණ ඒකක	ඉස්සන් නිෂ්පාදනය (මෙ.ටොන්)	මොදා මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටොන්)	මුහුදු කුඩැල්ලන් නිෂ්පාදනය (මෙ.ටොන්)	මුහුදු පැළෑටි නිෂ්පාදනය (මෙ.ටොන්)
උතුරු පළාත	1,256	0.50	552	265
නැගෙනහිර පළාත	1,124	832	-	-
වයඹ පළාත	11,575	-	-	6
දකුණු පළාත	125	2.60	11	-
එකතුව	**14,080**	**835.10**	**563**	**271**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

ව්‍යාප්ති අංශයේ ප්‍රගතිය

වගුව 11- **මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම**

දිස්ත්‍රික්කය	මත්ස්‍ය ඇඟිල්ලන් (මිලියන)	මිරිදිය ඉස්සන් පසු කීටයන් (මිලියන)
අම්පාර	18.21	0.60
අනුරාධපුර	21.34	2.11
බදුල්ල	6.38	1.64
මඩකළපුව	6.64	2.97
කොළඹ	0.64	0.65
ගාල්ල	0.62	0.70
ගම්පහ	0.46	0.35
හම්බන්තොට	9.83	6.67
යාපනය	0.79	-
කළුතර	0.8	0.35
මහනුවර	1.78	0.45
කෑගල්ල	0.11	0.09
කිළිනොච්චිය	3.29	-
කුරුණෑගල	8.4	1.93
මන්නාරම	1.34	0.65
මාතලේ	4.87	0.30
මාතර	0.94	0.96
මොණරාගල	14.95	3.06
මුලතිව්	4.64	1.65
නුවරඑළිය	2.77	1.20
පොළොන්නරුව	17.84	1.20
පුත්තලම	5.72	2.65
රත්නපුර	4.39	1.11
ත්‍රිකුණාමලය	5.32	3.64
වව්නියාව	2.48	1.07
එකතුව	**144.55**	**36.00**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

වගුව 12 – මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය

දිස්ත්‍රික්කය	*මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය* **(මෙ.ටොන්)**
අම්පාර	12,296
අනුරාධපුර	21,800
බදුල්ල	2,806
මඩකළපුව	3,301
කොළඹ	988
ගාල්ල	268
ගම්පහ	1,386
හම්බන්තොට	5,072
යාපනය	128
කළුතර	849
මහනුවර	1,383
කෑගල්ල	55
කිළිනොච්චිය	692
කුරුණෑගල	8,333
මන්නාරම	297
මාතලේ	1,787
මාතර	922
මොණරාගල	6,115
මුලතිව්	1,343
නුවරඑළිය	622
පොළොන්නරුව	13,668
පුත්තලම	3,520
රත්නපුර	1,442
ත්‍රිකුණාමලය	11,085
වව්නියාව	772
එකතුව	**100,930**

මූලාශ්‍රය: නැක්ඩා ,සැලසුම්, ඇගයීම් හා අධීක්ෂණ ඒකකය

6. ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

වැඩසටහන / ක්‍රියාකාරකම	වෙන් වූ මුදල (රු.මී)	වියදම (රු.මී)	භෞතික ප්‍රගතිය
විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය			
(1) විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන වල අවිච්ඡේද හා වැඩිදියුණු කිරීමේ කටයුතු - රම්බොඩගල්ල, ගිනිගත්හේන, සෙවනපිටිය, බංගදෙණිය	43.25	39.45 අතැති බිල්පත්- රු.මී. 1.11	කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ අවිච්ඡේද ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. ගාල්ල විසිතුරු මසුන් ප්‍රදර්ශන ඒකකය මහජනතාව සඳහා විවෘත කරන ලද අතර මාතර සහ කුරුණෑගල විසිතුරු මත්ස්‍ය ප්‍රදර්ශන ඒකක සඳහා විස්තරාත්මක සැලසුම් නිම කර ඇත. (භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව වැඩ නවත්වන ලදි). රම්බොඩගල්ල සුළු ප්‍රතිසංස්කරණ කටයුතු, සෙවණපිටියේ මාර්ග වැඩ සහ පින්තාරු කිරීමේ කටයුතු අවසන් කර ඇත. බංගදෙණිය සහ ගිනිගත්හේනේ විදුලිය ආශ්‍රිත වැඩ අවසන් කර ඇත.
නව මත්ස්‍ය අභිජනනාගාර වැඩිදියුණු කිරීම සහ ඉදිකිරීම			
(1) වැඩිදියුණු කිරීම සහ ඉදිකිරීම්: බංගදෙනිය වේක්කයා අභිජනනාගාරය, ඔලෙයිතුඩුව මුහුදු කූඩැල්ලන් අභිජනනාගාරය, කහඳමෝදර/ කල්ලරාව/ පම්බල/ අහුණවැව මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන, ධර්මපුරම් මුහුදු	51.80	33.08 අතැති බිල්පත් - රු.මී. 9.78	පම්බල මධ්‍යස්ථානය- මුහුදු ජල ටැංකියේ ඉදිකිරීම් අවසන් කර ඇති අතර අවසාදිත ටැංකියේ වැඩ නිම කර ඇත. කහඳමෝදර මධ්‍යස්ථානය- 100% ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

වරල් මත්ස්‍ය අභිජනනාගාරය			කල්ලරාව මධ්‍යස්ථානය- අවිච්ඡේද ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
			බංගදෙනිය වේක්කයා මත්ස්‍ය අභිජනනාගාරය - 100% ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
			ධර්මපුරම් මුහුදු වරල් මත්ස්‍ය අභිජනනාගාරය - 100% ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
මත්ස්‍ය අභිජනනය සහ මත්ස්‍ය නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීම			
(1) කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක වැඩිදියුණු කිරීම සහ ප්‍රජා මූලික මත්ස්‍ය අභිජනන ඒකක පිහිටුවීම	25.65	10.02 අතැති බිල්පත් - රු.මි. 13.43	කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක වැඩිදියුණු කිරීම - ඒකක 10 ක් සම්පූර්ණ කර ඇත. ප්‍රජා මූලික මත්ස්‍ය අභිජනන ඒකක පිහිටුවීම - එක්ගල්ඔය, වැඩ අවසන් කර ඇත. කුරුණෑගල සහ මඩකලපුව යන ප්‍රදේශවල ඉඩම් හඳුනාගෙන ඇති අතර නව ව්‍යාපෘති ආරම්භ කිරීමට දැනට පවතින සීමාවන් හේතුවෙන් වැඩ නතර කර ඇත.
(2) මත්ස්‍ය බීජ ප්‍රවාහනයට පහසුකම් සැලසීම	6.03	6.03	100% වැඩ අවසන් කර ඇත.
(3) උපකරණ මිල දී ගැනීම ඇතුළුව දඹුල්ල මත්ස්‍ය ජාන ඒකකයේ අවිච්ඡේද වැඩ	8.02	4.55 අතැති බිල්පත් - රු.මි. 1.82	අවිච්ඡේද වැඩ අවසන් කර ඇත.
ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන නඩත්තු කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම			
(1) ජලජීවී වගා සංවර්ධන	100.25	76.30	දඹුල්ල මධ්‍යස්ථානය -

මධ්‍යස්ථාන නඩත්තු කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම - උඩවලව, දඹුල්ල, ඉහිනියාගල, කලාවැව, මුරුතවෙල, නුවරඑළිය, ඉරණමඩු		අතැති බිල්පත් - රු.මි. 23.67	අවසාදිත ටැංකියේ සහ පොකුණු 5ක් ඉදිකිරීම අවසන් කර ඇත.
			කලාවැව මධ්‍යස්ථානය - පොකුණු 8ක් ඉදිකිරීම අවසන් කර ඇත.
			නුවරඑළිය මධ්‍යස්ථානය - පොකුණු 8ක් සහ රැඳවුම් බැම්මක් ඉදි කර අවසන්.
			උඩවලව (කාප්/නව) මධ්‍යස්ථානය - අවසාදිත ටැංකි 2 ක් සහ පොකුණු 6 ක් ඉදිකිරීම අවසන් කර ඇත.
			උඩවලව (තිලාපියා) මධ්‍යස්ථානය - අවසාදිත ටැංකියේ ඉදිකිරීම් අවසන් කර ඇත.
			ඉහිනියාගල මධ්‍යස්ථානය - අවසාදිත ටැංකිය, ප්‍රධාන ජලාපවහන මාර්ගය සහ පොකුණු 2ක් ඉදිකර අවසන් කර ඇත.
			මුරුතවෙල මධ්‍යස්ථානය - කොන්ත්‍රාත්තුව නවතා ඇත.
නොමිලයේ මත්ස්‍ය බීජ තැන්පත් කිරීම			
(1) මධ්‍යස්ථාන වලින් මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම	135.00	123.38 අතැති බිල්පත් - රු.මි. 7.84	ඇඟිල්ලන් මිලියන 39.83 තැන්පත් කර ඇත.
(2) මධ්‍යස්ථාන වලින් මත්ස්‍ය ඇසිත්තන් තැන්පත් කිරීම	45.50	29.02 අතැති බිල්පත් - රු.මි. 3.72	ඇසිත්තන් මිලියන 55.82 තැන්පත් කර ඇත.
කුඩා පරිමාණ මත්ස්‍ය බීජ	225.00	146.19	ඇඟිල්ලන් මිලියන 59.21

නිෂ්පාදන ඒකක, පෞද්ගලික පොකුණු වලින් මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම		අතැති බිල්පත් - රු.මි. 45.64	තැන්පත් කර ඇත.
(4) මධ්‍යස්ථාන වලින් මිරිදිය ඉස්සන් පසුකීටයන් තැන්පත් කිරීම	60.00	36.65 අතැති බිල්පත් - රු.මි. 11.63	මිරිදිය ඉස්සන් පසුකීටයන් මිලියන 27.14 තැන්පත් කර ඇත.
(5) මත්ස්‍ය බීජ ප්‍රවාහනය	24.50	17.59 අතැති බිල්පත් - රු.මි. 4.43	මත්ස්‍ය බීජ ප්‍රවාහනය සිදුකර ඇත.
නව නිෂ්පාදන සඳහා ආයෝජන කලාප			
(1) පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් ගොවිපල සඳහා පොදු විදුලි සැපයුමක් ලබා දීම	74.71	67.43	ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඇස්තමේන්තු ඉල්ලා ඇත. රු. මිලියන 67.43 ක් වටිනා ඇස්තමේන්තු ලබා ගෙන ගෙවීම් කරන ලදී. ඉන්ධන අර්බුදය හේතුවෙන් වැඩ කටයුතු පමා වූ අතර වැඩ කටයුතු සිදු වෙමින් පවතී.
(2) ලන්දේසි ඇළ හැරීම	42.94	36.40	අදියර 1 යටතේ කි.මී. 2.5 හාරා ඇති අතර අදියර 1 නිම කර ඇත.
(3) ඉඩම් මැනීමේ මූලික කටයුතු සහ පොදු යටිතල පහසුකම් - හම්බන්තොට ගල්මුල්ල	13.93	13.93	ආයෝජකයින් තෝරාගැනීම සඳහා උනන්දුවක් දක්වන්නන්ගෙන් යෝජනා කැඳවූ අතර ආයෝජකයින් දෙදෙනෙකු තෝරාගෙන අක්කර 100 බැගින් නිදහස් කිරීමට තීරණය කරන ලදී. ජල හා විදුලි අවශ්‍යතා ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා

			වෙත දන්වා ඇත. ජල හා විදුලි අවශ්‍යතා අදාළ ආයතන වෙත දැනුම් දී ඇත. කැබිනට් පත්‍රිකා කෙටුම්පත සකස් කර ධීවර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අවබෝධතා ගිවිසුම නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ජල සැපයුම සඳහා ඇස්තමේන්තු ලබා ගෙන ගෙවීම් කර ඇත.
(4) පොදු යටිතල පහසුකම් - මන්නාරම, වෙඩිතලතිව්	10.00	8.76	ජල හා විදුලි අවශ්‍යතා ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා වෙත දන්වා ඇත. ආයෝජකයින් තෝරා ගැනීම සඳහා උනන්දුවක් දක්වන්නන්ගෙන් යෝජනා කැඳවූ අතර අයදුම්පත් 15 ක් ලැබී ඇති අතර ඇගයීම් සිදු කෙරෙමින් පවතී. ඉඩම් මැනීම් කටයුතු අවසන් කර ඇත. ව්‍යාපෘති යෝජනා කැඳවන ලද සහ ව්‍යාපෘති යෝජනා ලේඛන 2023.01.05 දින විවෘත කිරීමට නියමිතය. තෙකලා විදුලිය සැපයීම සඳහා ගෙවීම් කර ඇත.
(5) ඉඩම් මැනීමේ කටයුතු සහ පොදු යටිතල පහසුකම් - මඩකළපුව කොක්කඩිචෝලේ සහ වාකරේ	61.20	36.75 අතැති බිල්පත් - රු.මි. 24.43	ජල හා විදුලි අවශ්‍යතා ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා වෙත දන්වා ඇත. ආයෝජකයින් තෝරා ගැනීම සඳහා උනන්දුවත් දක්වන්නන්ගෙන් යෝජනා

			කැඳවූ අතර කොක්කඩිචෝලේ ජලජීවී වගා කලාපය සඳහා මහා පරිමාණ 5ක්, මධ්‍ය පරිමාණ 12ක්, කුඩා පරිමාණ ආයෝජකයින් 40ක් තෝරා ගන්නා ලදී.කොක්කඩිචෝලේ ඉඩම් බදු දීමේ ගිවිසුම මඩකලපුව දිස්ත්‍රික් ලේකම් සහ මන්මුනේ වයඹ ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලදී. කොක්කඩිචෝලෙයි සංකල්පිත සැලැස්ම අවසන් කර ඇත. කොක්කඩිචෝලෙයි ඉඩම සඳහා ජලය සහ විදුලිය සැපයීම සඳහා ගෙවීම් කර ඇත. කොක්කඩිචෝලේ අවබෝධතා ගිවිසුම නීතිපති දෙපාර්තමේන්තුවට යවා ඇත. පාරිසරික අවසරය ලබා ගැනීම සිදු කරමින් පවතී. වාකරේ ඉඩම මැනීම් කටයුතු අවසන් කර ඇත. වාකරේ කලාපය සඳහා ආයෝජකයින් තෝරා ගැනීම සඳහා උනන්දුවත් දක්වන්නන්ගෙන් යෝජනා කැඳවූ අතර ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී. ආයෝජකයින් තෝරා ගැනීම සහ එහි ප්‍රගතිය ඇගයීම සඳහා උනන්දුව ප්‍රකාශ කිරීම.
"සමෘද්ධි අරුණළු " යටතේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - කාන්තා, ළමා සේවා හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය			
(1) පවතින විසිතුරු මත්ස්‍ය	67.575	25.25	ප්‍රතිලාභීන් 202 දෙනෙකුට

ගොවිපළ වැඩිදියුණු කිරීම සඳහා 2වන වාරික නිකුත් කිරීම		අතැති බිල්පත් - රු.මි. 26.25	2වන වාරිකය නිකුත් කර ඇත. තවත් වාරික 210ක් ලබාදීමට යෝජිත අතර නමුත් ඒ සඳහා මුදල් ලැබී නැත.
(2) ඇක්වේරියම් වැඩිදියුණු කිරීම් සඳහා 2 වන වාරික නිකුත් කිරීම	4.000	2.50 අතැති බිල්පත් - රු.මි.1.125	ප්‍රතිලාභීන් 20 දෙනෙකුට 2 වන වාරික නිකුත් කර ඇත. තවත් වාරික 09ක් ලබාදීමට යෝජිත අතර නමුත් ඒ සඳහා මුදල් ලැබී නැත.
ධීවර හා ජලජීවී වගා අංශය සංවර්ධනය - ජීවනෝපාය සංවර්ධනය (කලපුව සහ වෙරළ ආශ්‍රිත), නිෂ්පාදන වැඩිදියුණු කිරීම			
(1) මුහුදු පැළැටි වගාව	7.15	1.75 අතැති බිල්පත් - රු.මි. 6.25	ප්‍රතිලාභීන් 35ක් සඳහා මුදල් ලබා දී ඇත.
(2) මුහුදු කූඩැල්ලන් වගාව	25.00	18.75	ප්‍රතිලාභීන් 75ක් සඳහා මුදල් ලබා දී ඇත. තවත් ප්‍රතිලාභීන් 25ක් තෝරාගෙන ඇති අතර ඒ සඳහා මුදල් ලැබී නැත.
(3) මොදා මත්ස්‍ය වගාව	2.50	අතැති බිල්පත් - රු.මි. 0.50	ප්‍රතිලාභීන් 4 දෙනෙකු සඳහා දෙවන වාරිකය ලබා දීමට සැලසුම් කර ඇති නමුත් ඒ සඳහා මුදල් ලැබී නැත.
(4) ඔලිතුඩුවායි හි මුහුදු කූඩැල්ලන් අභිජනනාගාරය වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු කිරීම සඳහා උපදේශක ගාස්තුව ගෙවීම	0.47	0.47	උපදේශක ගාස්තු ගෙවා ඇත.
(5) පීසීආර් පරීක්ෂණ කට්ටල ලබා දීම	22.50	13.92	පීසීආර් පරීක්ෂණ කට්ටල මිල දී ගෙන ඇත.
(6) මන්නාරම, මුලතිව්, කිලිනොච්චි සහ යාපනය දිස්ත්‍රික්ක වල කූඩු/ කොටු තුළ	27.65	අතැති බිල්පත් - රු.මි. 25.00	ප්‍රතිලාභීන් 100ක් තෝරාගෙන ඇති නමුත් ඒ සඳහා මුදල් ලැබී නැත.

මොදා මත්ස්‍ය වගාව			
(7) නැගෙනහිර පළාතේ කූඩු තුළ සේලයින් තිලාපියා වගාව	11.40	7.50	ප්‍රතිලාභීන් 30ක් සඳහා මුදල් ලබා දී ඇත.
(8) නැගෙනහිර පළාතේ සේලයින් තිලාපියා වර්ධක පද්ධති ස්ථාපිත කිරීම	1.23	0.75	ප්‍රතිලාභීන් 3ක් සඳහා මුදල් ලබා දී ඇත.
(9) නැගෙනහිර පළාතේ ඉස්සන් වගාකරුවන්ට විදුලිය ලබාදීම	10.00	-	ස්ථාන හඳුනාගෙන විදුලිබල මණ්ඩලයෙන් ඇස්තමේන්තු ඉල්ලුම් කර ඇත .
(10) විසිතුරු මත්ස්‍ය වගාව සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම	2.00	1.50 අතැති බිල්පත් - රු.මි. 0.50	ප්‍රතිලාභීන් 6ක් සඳහා මුදල් ලබා දී ඇත. තවත් ප්‍රතිලාභීන් 2ක් තෝරාගෙන ඇති අතර ඒ සඳහා මුදල් ලැබී නැත.
(11) පුදුමුරිප්පු හි මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා හා ආහාරය පිණිස මත්ස්‍ය පැටවුන් වර්ධනය කරන මත්ස්‍ය වගා ටැංකි ප්‍රතිසංස්කරණය කිරීම	5.00	අතැති බිල්පත් - රු.මි. 4.36	ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. ගෙවිය යුතු මිල වෙනස්කම් සඳහා මුදල් ලැබී නැත.
(12) කලපු වල ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම (තෝරාගත් කලපු වල මිලියන 25 ක තැන්පත් කිරීම) (තොණ්ඩමනාරු, පානම, ගරාදූව, මඩකලපුව, චුන්ඩිකුලම්, නන්දිකඩාල්, මුරුත්තන්කර්නි, නයාරු)	15.00	0.06	ඉස්සන් අභිජනන කටයුතු සිදු කරන ලදී. ගරාදූව කලපුවේ ඉස්සන් පසු කීටයන් 10,000ක් තැන්පත් කර ඇත.
(13) මිරිදිය මසුන් සඳහා ආහාර	55.00	18.89	ආහාර මිල දී ගෙන ඇත.
(14) මිරිදිය ඉස්සන් පසුකීටයන් සඳහා ආර්ටීමියා	7.65	7.65	ආර්ටීමියා මිල දී ගෙන ඇත.
(15) හෝර්මෝන	8.50	5.81	හෝර්මෝන මිල දී ගෙන ඇත.
(16) ට්‍රයික්ලෝරෆෝන්	7.35	7.17	ට්‍රයික්ලෝරෆෝන් මිල දී ගෙන ඇත.
(17) බ්ලීච්	9.90	8.24	බ්ලීච් මිල දී ගෙන ඇත.
(18) දැල් සහ උපාංග	10.00	9.69	දැල් මිල දී ගෙන ඇත.

(19) කාලීන ජලාශ සහ වතු ජලාශ සඳහා දැල් ලබා දීම	18.00	-	ලංසු කැඳවා ඇගයීම් කර ප්‍රදානය කර ඇති නමුත් දැල් සහ උපාංග 2022 වසරේ දී ලබා දිය නොහැකි බව දන්වා ඇත.
ප්‍රාග්ධන වියදම්			
(1) වාහන නඩත්තු කිරීම	1.25	1.25	වාහන අලුත්වැඩියා කරන ලදි.
(2) තොරතුරු තාක්ෂණ සේවා පිහිටුවීම	5.65	5.65	විද්‍යුත් තැපෑල අලුත් කරන ලදී. වාර්ෂික වෙබ් අඩවි සඳහා සේවා අලුත් කරන ලදී. Firewall ප්‍රසම්පාදනය අවසන් කරන ලදි. වෛරස් ආරක්ෂක මෘදුකාංගය මිල දී ගැනීම. Windows 10 මෙහෙයුම් පද්ධති මිලදී ගැනීම.
(3) ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම (ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, දිස්ත්‍රික් ව්‍යාප්ති කාර්යාල හා ප්‍රධාන කාර්යාලය)	1.28	1.28	කාර්යාල උපකරණ මිලදී ගෙන ඇත.
(4) යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම (ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන)	0.07	0.07	ජල පොම්ප මිලදී ගෙන ඇත.
(5) බංගදෙණියේ ඉඩම අත්පත් කර ගැනීම	0.23	0.23	ඉඩම අත්පත් කර ගෙන ඇත.
(6) නිලධාරීන් සහ වගාකරුවන් පුහුණු කිරීම	1.52	0.70	දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. කාර්මික නිලධාරීන් සඳහා පුහුණුව ආරම්භ කර ඇත. ජලජීවී වගාව සහ ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව නිලධාරීන් 18 දෙනෙකුට ලබා දීම.

7. ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වන්නේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ මිරිදිය මත්ස්‍ය පරිභෝජනය වැඩිකිරීම, රැකියා අවස්ථා බිහි කිරීම, ජලජ සම්පත් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ප්‍රමාණය වැඩිකිරීම ඉලක්ක කර ගෙන ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් සහ ජලජීවී වගා කර්මාන්තයේ තිරසර සංවර්ධනය සහ කළමනාකරණය කිරීමයි.

8. ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 100% ක් භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධනය ආයෝජනය කරනු ලබන රජයේ අයතනයකි. මෙහි අනුමත මූලික ප්‍රාග්ධනය රුපියල් මිලියන 90 කි.

9. ආදායම්

මත්ස්‍ය බීජ විකිණීමෙන්, මධ්‍යස්ථාන බදු දීමෙන් හා අනෙකුත් ආදායම් වශයෙන් අධිකාරිය ලබා ඇති ආදායම රුපියල් මිලියන 415.67 ක් වේ. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් අරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 556.14ක් වේ.

10. අධිකාරියේ ක්‍රියාකාරකම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 103.99 ක වියදම ඉක්ම වූ ආදායමක් ලබා ඇත.

11. කාර්යයන් පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 වන දිනට අධිකාරියේ ශේෂ පත්‍රය මූල්‍ය වාර්තාවේ දක්වා ඇත.

12. ප්‍රාග්ධන වියදම්

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙනුවෙන් 2022 වර්ෂයේ දී රුපියල් මිලියන 10.00 ක ප්‍රාග්ධන වියදම් සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන්කර දී තිබූ අතර ඉන් රුපියල් මිලියන 9.81 ක් ලබා දී ඇත. මෙම සම්පූර්ණ වෙන් කළ ප්‍රතිපාදන භාවිතා කරනු ලැබුවේ වාහන හා උපකරණ අළුත්වැඩියාව, ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සහ ජලජීවී වගා සංවර්ධන කටයුතු සඳහා යෙදවීමටය.

තවද, අධිකාරිය වෙත රු. 2022 වර්ෂය සඳහා ධීවර අමාත්‍යාංශය සහ ධීවර රාජ්‍ය අමාත්‍යාංශය යටතේ මිලියන 815.45ක් ලබා දී ඇති අතර එම මුදල් මත්ස්‍ය අභිජනනය හා නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම, ජලජීවී මධ්‍යස්ථාන අළුත්වැඩියාව හා නඩත්තුව, විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය, නොමිලේ මත්ස්‍ය/ඉස්සන් පැටවුන් තැන්පත් කිරීම, මත්ස්‍ය අභිජනනාගාර ඉදිකිරීම හා අළුත්වැඩියාව, යටිතල පහසුකම් සහිත ජලජීවී ගොවිපළ කලාප සංවර්ධනය සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා වැයකර ඇත.

විදේශ ආධාර යටතේ අධිකාරිය වෙත රු. මිලියන 10.45 එක්සත් ජාතීන්ගේ ILO වැඩසටහන සහ ජලජීවී වගා සංවර්ධනය සඳහා ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (ACIAR) වෙතින් ජලජීවී වගා සංවර්ධනය සඳහා ලබා දී ඇත.

13. වෙනත් නියෝජිත ආයතන සමඟ සම්බන්ධතා

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, සීමාසහිත සී-නෝර් පදනම, පළාත් සභා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධ වී සහයෝගයෙන් කටයුතු කරන ලදි. එසේම පෞද්ගලික අංශය සමඟ එක්ව කිවුල්දිය ඉස්සන් අභිජනනාගාරය, රැකව ඉස්සන් වගා ගොවිපළ සහ වාකරේ ඉස්සන් ගොවිපල ක්‍රියාත්මක කරන ලදි.

14. ආයතනය එළඹ ඇති කොන්ත්‍රාත් කෙරෙහි අධ්‍යක්ෂ වරුන්ගේ මැදිහත් වීම

2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ආයතනය එළඹී ඇති කොන්ත්‍රාත්තු සඳහා සෘජුවම හෝ වක්‍රව මැදිහත්වීම් සිදුකොට නැත.

15. විගණකවරු

2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලද්දේ රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසිනි.

මගේ අංකය / எனது இல. / My No. } එන්එල්එස්/ඒ/නැක්ඩා/1/එල්/ඒ/2022/01

මගෙ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 සැප්තැම්බර් 19 දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයසඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන හා වෙනත් තෙතිකෘ හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1.මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම ප්‍රකාශයේ, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ,1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන පනතේසහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින්2022දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංගගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 <u>නත්ත්වාගණනය කළ මනය සඳහා පදනම්</u>

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02හි 25(උ) වගන්තිය ප්‍රකාරව ඉදිරි ගනුදෙනු, ඉදිරි ගිවිසුම්, ණුවමාරු ගිවිසුම් සඳහා මුදල් ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ගිවිසුම් යටතේ සමාලෝචිත වර්ෂයේ අධිකාරියට ලැබුණු රු.5,500,000 ක් වූ මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය යටතේ වෙනත් ආදායම් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2හි 29 වගන්තිය ප්‍රකාරව සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී අතිරික්තය සමඟ ශුද්ධ මුදල් ප්‍රවාහය සසඳා හෙළිදරව් කලයුතු වුවත් අධිකාරිය විසින් එසේ සිදුකර නොතිබුණි.

(ඇ) අක්ෂරයක් පමණ වූ මන්නාරම ඔලෙයිතුඩාව මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරයේ ඉඩම රු.800,000ක වටිනාකමකට 2016 වර්ෂයේ සිට අවු.30 කට බදු පදනම මත ලබාගෙන තිබුණ ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 06 වගන්තියේ විධිවිධාන අනුව කල්බදු දේපලක් ලෙස ගිණුම්වල හඳුනාගෙන නොතිබුණි.

(ඇ) ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් රු. මිලියන 143ක් වැයකර මඩකලපුව දිස්ත්‍රික්කයේ බහු විශේෂ කරදිය වරල් මත්ස්‍ය අභිජනනාගාරයක් ඉදිකර 2017 ජූනි 29 වන දින අධිකාරියට භාරදී තිබුණි. 2022 සැප්තැම්බර් 08 වන දින එම වත්කම් රු.155,450,000 කට තක්සේරු කර තිබුණද එය මෙතෙක් අධිකාරියට පවරාගෙන එම වටිනාකම් ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් ඒංගම නොවන වත්කම් හා රජයේ ප්‍රදාන අඩුවෙන් දැක්වුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8හි 100 වගන්තිය පරිදි වාර්තා කරන දිනට ඇති සැම අසම්භාව්‍යය වගකීමක්ම හෙළිදරව් කළයුතු වුවත්, වැලිකන්ද අභිජනනාගාර ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත් ඉදිකිරීම් සමාගමක් වෙත බෙරුම්කරණ සභා නීන්දුවකින් ගෙවීමට සිදුව තිබූ රු.26,839,477 ක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් නීතිපති දෙපාර්තුමේන්තුවේ උපදෙස් ලබාගැනීම් හා මහාධිකරණ නඩු ගොනු කිරීම් සඳහා ක්‍රියාමාර්ග ගෙන නිබීමද අධිකාරියට එරෙහිව කොන්ත්‍රාත්කරුවන් හා අනිකුත් පාර්ශවයන් අධිකරණයේ ගොනුකර තිබුණු නඩු 10ක් සම්බන්ධයෙන්ද මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය සඳහා වගාකරුවන්ට ලබාදුන්, මුදල් අය නොවීම් සම්බන්ධයෙන් අධිකරණයේ පවරන ලද නඩු 193ක් සම්බන්ධයෙන්ද එලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ අධිකාරිය වෙත සංවර්ධන වැඩසටහන් සඳහා ලද රු. 482,746,457 ක අමාත්‍යාංශ ප්‍රදාන සහ රු. 10,454,968 ක විදේශ ප්‍රදාන වශයෙන් ලද මුළු ප්‍රදාන එකතුව රු. 493,201,425 ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 හි වගන්ති අංක 95 හි විධිවිධාන ප්‍රකාරව ආදායමට හඳුනා ගැනීමකින් තොරව ව්‍යාපෘති ගිණුම්වලට බැර කර තිබුණි. එම වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද රු. 483,621,100 ක් වූ මුළු වියදම ද ආදායම් ප්‍රකාශය තුලට නොගෙන ව්‍යාපෘති ගිණුම් වලට හර කර තිබුණි.

(උ) දඹුල්ල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයට 2017,2018 සහ 2019 වර්ෂවලදී ලැබුණු ආදායම්වලින් බැංකුගත නොකර අවභාවිතා කර තිබුණු රු.1,628,497 ක්වූ ආදායම් 2022 වර්ෂය දක්වාම ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) පුදුකුඩිරිප්පුහි පිහිටිරු.75,880,829 ක්වූ ඉස්සන් අභිජනනාගාරය, ජලජීවී වගා සංවර්ධන හා තක්ත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය විසින් 2009 දෙසැම්බර් 30 දින අධිකාරියට භාරදී තිබුණද එය එදින සිට වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. 2015 ජූනි 22 දිනැති තක්සේරු වාර්තාවට අනුව මෙම අභිජනනාගාර ඉඩම රු. 3,721,600කටද, ගොඩනැගිල්ල රු. 44,230,000කටද, ලී බඩු හා සවි කිරීම්, මෝටර් සයිකල්, වායු සමීකරණ යන්ත්‍ර, ජෙනරෙටර් හා අනෙකුත් තොග වටිනාකම් රු.3,146,550කටද තක්සේරු කර තිබූ අතර එම අයිතම කිසිවක් ගිණුම් ගතකර නොතිබූ අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලින්ද මෙම භාණ්ඩවල පැවැත්ම තහවුරු කර නොතිබුණි. මෙම වත්කම් 2016 වර්ෂයේ සිට රාජ්‍ය පෞද්ගලික හවුල් ගිවිසුම් යටතේ බදු දී තිබූ අතර මෙම ආයෝජන වටිනාකම් 2016 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වාම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගතකර නොමැති බැවින් 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2022 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදාලව රු. 1,050,000 ක්වූ පුදුකුඩිරිප්පුහි පිහිටි ඉස්සන් අභිජනනාගාරය වෙතුවෙන් ලැබිය යුතු බදු මුදල ගිණුම්ගත කර නොතිබුණු අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය සහ ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඒ) 2017 වර්ෂයේ සිට 2020 දක්වා අමාත්‍යාංශ ප්‍රදාන වලින් ඉදිකර තිබුණු හම්බන්තොට රැකව ක්‍රැබ්සිටී අභිජනනාගාරය සඳහා වූ රු.221,719,566 ක වියදම ජංගම නොවන වත්කම් හා විලම්බිත ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකම් විලම්බිත ආදායම් ගිණුමෙන් ඉවත් කර කල්බදු අවිනිශ්චිත ආදායම් ගිණුමක් ලෙස ජංගම නොවන බැරකම් යටතේ ඇතුලත් කර තිබුණි.

(ඔ) කෙරිගෙන යන වැඩ ප්‍රාග්ධනීත කිරීමේදී රු.301,139,489 ක්වූ කෙරිගෙන යන වැඩ වටිනාකම් රු305,691,169ක් ලෙස ප්‍රාග්ධනීත කිරීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් හා අමාත්‍යාංශ ප්‍රදාන රු.4,551,680 වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) කොන්ත්‍රාත් බිල්පත් සඳහා ගෙවිය යුතු රු.4,016,127ක්වූ කොන්ත්‍රාත් වටිනාකම් ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගත නොකර දේශීය ප්‍රදානවලට බැර කිරීම නිසා ඉංගම් වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ක) අමාත්‍යාංශ හා රජයේ ආයතන වසින් අධිකාරියට භාර දී ඇති දැනට භාවිතා කරන හෙක්ටයාර් 62.7702ක ඉඩම් 10ක්, අක්කර 10 ½ක ඉඩම් 2ක් සහ පර්. 41.197ක ඉඩම්වල වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) 2014 ජූලි 16 දිනැති නක්ශේරු වාර්තා අනුව බත්තුළුඔය ජලජීවී වගා කාර්යාලයේ ඉඩම් රු.4,000,000 කට නක්ශේරු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එය රු. 2,599,000ක් ලෙස ගිණුම් ගතකර නිබීමෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ ශේෂය රු.1,401,000 අඩුවෙන් දැක්වුණි.

(ව) සමාලෝචිත වර්ෂයේ එකක 4782 ක්වූ රු. 1,008,663 වටිනා මියගිය මව් මත්ස්‍ය (Death Brood Stock) තොගය වර්ෂයේ පාඩු හා හානි ලෙස වියදමට ගිණුම්ගත කර නොමැති බැවින් ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපණය වී තිබුණි.

(ශ) උඩවලව (නව) සහ දඹුල්ල (genetic) මධ්‍යස්ථානයන්හි 2022 දෙසැම්බර් 31 දිනට කි.ග්‍රෑ.1878ක් සහ ඒකක 7560ක්වූ රු.2,759,315ක් වටිනා මව් මත්ස්‍ය තොග ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සීව මත්ස්‍ය තොගයට ඇතුලත් කර නොතිබීම නිසා එම ප්‍රමාණයෙන් ඉංගම් නොවන වත්කම් අඩුවෙන් හා වර්ෂයේ විකුණුම් පිරිවැය වැඩිවී ලාභය අඩුවෙන් දැක්වුණි.

(ට) 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු. 2,855,551 ක්වූ හිඟ වැටුප් හා වේතන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී කල ගෙවීම් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය අඩුවෙන් දැක්වුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ තොග සමීක්ෂණයක් නොකර, මධ්‍යස්ථාන භාරව සිටින ස්ථානභාර නිලධාරීන්ගේ වාර්තා අනුව තොග වටිනාකම් රු.101,615,570ක් ලෙස ගිණුම් ගතකර තිබීම හේතුවෙන් මෙම වටිනාකමෙහි නිවැරදිතාවය හා පැවැත්ම නඟවුරු නොවීය.

(ණ) 2018 වර්ෂයේ සිට පැවත එන ව්‍යාපෘති සඳහාවූ ප්‍රතිපාදන වියදම් කර ඉතිරි වූ රු.4,812,922ක ශේෂය අදාළ ආයතන වෙත ගෙවීමට හෝ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හෝ කර නොතිබුණි.

(ත) 2022 වර්ෂයේ ඉඩම් සඳහා ඉදිරිපත් කරන ලද උපලේඛණයන්හි රු.225,000 ක වටිනාකමකට මිලදීගත් ඉඩමක් ඇතුළත් කර නොතිබූ අතර නක්ෂේරු කරන ලද එකතු වටිනාකම රු.32,971,600 ක්වූ අක්කර 10.5 ක ඉඩම් 02 ක් සහ හෙක්ටයාර 0.3772 ක ඉඩම් 02 ක් ගිණුම් ගතකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ.මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත්විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම් අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නිති හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම් සඳහා අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද,අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරවකිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අයිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවලල් සම්බන්ධයෙන් වූ හෙළිදරවකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශන වල විශ්වසනීය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරවකිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම් කොටසේ දක්වා ඇති නිරීක්ෂණ වලට යටත්ව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ආ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ආ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේපාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයෝජකයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ** මුදල් රෙගුලාසි 136, 137, 138, 139	ආයතනය තුල මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක වුවද, එම මෘදුකාංගය පද්ධතියට දත්ත ඇතුලත් කිරීම, දත්ත පරිශීලනය, වාර්තා ලබා ගැනීම හා සංශෝධනය කිරීම යන කාර්යයන් සඳහා අධිකාරිය නිසි පරිදි බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.
(ආ) රාජ්‍ය ගිණුම් වකුලේඛ 30/94 (4.4) හා 2022 ජූලි 08	රාජ්‍ය සංස්ථා විසින් ප්‍රයෝජනයට ගනු ලබන විදේශාධාර සම්බන්ධව වැය ඇස්තමේන්තුවට ප්‍රතිපාදන සලසා රේඛීය අමාත්‍යාංශය හරහා ආයතනය වෙත විදේශ ප්‍රදාන ලැබිය යුතු වුවද සමාලෝචන වර්ෂයේ අධිකාරිය වෙත ලැබී ඇති රු.මි.10.45 ක්වූ විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් එම විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ)	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2011 ආප්‍රේල් 21 දිනැති අංක MOEF/ERD/2011/01 දරන චක්‍රලේඛය හා 2014 ජූනි 26 දිනැති අංක MOEF/ERD/2014/01 දරන චක්‍රලේඛය	විදේශ ප්‍රදාන ලබාදීම සහ ගිවිසුම්වලට එළඹීම සම්බන්ධ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සිදුවිය යුතු වූවද අධිකාරිය වෙත ලැබී ඇති රු.මි.10.45 ක්වූ විදේශ ප්‍රදාන සම්බන්ධව ඒ අයුරින් කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 <u>වෙනත් කරුණු</u>

(අ) රු. 8,262,017ක්වූ කෙරීගෙන එන වැඩ ලෙස හිඟුම්ගහකර තිබුණු කොන්ත්‍රාත් අංක 2021/R/MURL/01 දරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුරුතුවෙල පලාදී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් මේ වන තෙක් ඉටු වී නොතිබුණි.

(ආ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුරුතවෙල වගා සංවර්ධන මධ්‍යස්ථානයේ කොන්ත්‍රාත් අංක 2021/R/MURL/02 දරන ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමේ කොන්ත්‍රාත්තුව දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2022 අප්‍රේල් 20 වන දින අවලංගු කර තිබුණි.අත්තිකාරම් හා ගෙවීම් බිල්පත් ලෙස ගෙවූ රු.4,412,475 ක මුදල අයකර ගැනීමට නොහැකිවී තිබූ අතර ගෙවූ මුදලද නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

(ඇ) උපදේශන සේවා ආයතනයක් වෙත 2016 හා2017 වර්ෂවලදී ගෙවන ලද රු.4,683,789 ක්වූ මුදලට අදාළව උපදේශන සේවා සම්පූර්ණ කර නොනිමියදී නැවත වරක් 2022 වර්ෂයේ මඩකලපු දිස්ත්‍රික්කයේ පලාදී උයනක් ඉදි කිරීම සඳහා සැලසුම් කිරීමේ හා ඉදිකිරීමේ උපදේශන සේවා කටයුතු එම ආයතනයටම රු.4,219,408 ක මුදලකට පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම කොන්ත්‍රාත්තුවට අදාළව රු.1,538,750 ක් ප්‍රාග්ධනීත කර තිබුණද අදාළ වැඩ සම්පූර්ණ කර නොනිබූ බැවින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබූ අතර එම ගෙවීම්ද නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) ගාල්ල සමනල උද්‍යානයේ විසිතුරු මසුන් ඒකකය (Ornamental Fish Display Unit) වැඩිදියුණු කිරීම සඳහා අධිකාරිය විසින් රු. 13,135,274 ක් වැයකර තිබුණද විසිතුරු මසුන් ඒකකය නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් වැය කරන ලද මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ඉ) අදාළ ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් අධිකාරියේ ප්‍රයෝජනය සඳහා අමාත්‍යාංශය වෙත භාරදී තිබුණු හෙක්ටයාර් 137.0294ක මත්නාරම හා වව්නියාව යන ප්‍රදේශවල ඉඩම් 02ක්හා අක්කර 2 බැගින් වූ මුලනිව හා යාපනය යන ප්‍රදේශවල ඉඩම් 02ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඊ) අධිකාරියට හිමිකාරිත්වය නොමැති හෙක්ටයාර් 1361.76 ක ඉඩම් 04ක සහ වපසරිය හඳුනාගත නොහැකි ඉඩමක් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට 2017 වර්ෂයේ සිට රු.මිලියන 107.6 ක මුදලක් වැයකර තිබුණද 2024 මැයි 05 දක්වා කිසිදු ව්‍යාපෘතියක් ආරම්භකර නොතිබූ බැවින් එම වියදම නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.

(උ) තිලාපියා මත්ස්‍යයන් සඳහා අවශ්‍ය ආහාර නිපදවීමට 2019 ඔක්තෝබර් 08 දින රු.11,802,000 ක් වටිනා උඩවලව මත්ස්‍ය ආහාර සැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කරනිබූ මත්ස්‍ය ආහාර නිෂ්පාදන යන්ත්‍රය මඟින් වාර්ෂිකව තිලාපියා මත්ස්‍ය ආහාර කිලෝග්‍රෑම් 127,000 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කළද, 2021 හා 2022 වර්ෂයේ කිලෝ ග්‍රෑම් 36,612 ක් හා කිලෝ ග්‍රෑම් 38,361 ක් එනම් සියයට 28 ක් හා සියයට 30ක ප්‍රතිශතයක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. මේ වනවිට මෙම යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන තිබුණි.

(ඌ) මත්ස්‍ය ටැංකිවල ධාරිතාවය හා 2022 වර්ෂයේදී මධ්‍යස්ථාන 4න වර්ග මීටර 34320ක ධාරිතාවයකින් යුතු මත්ස්‍ය ටැංකි නිෂ්කාර්යව පැවති අතර රම්බඩගල්ල විසිතුරු මත්ස්‍ය ටැංකි අතරින් ටැංකි 200 ක්ද අලුත්වැඩියා කලයුතු මට්ටමේ පැවතියද ක්‍රියාකාරී නිෂ්පාදන මට්ටමට පත්කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(එ) වෙක්කයා මසුන් අභිජනනාගාරය හා කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනනාගාරය ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කර 2022 ඔක්තෝම්බර් 10 දින අවසන් කර තිබුණි.මේ සඳහා රු.309,976,861 ක් හා රු.212,124,697ක් පිරිවැයක් දරා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ඉහත පරිදි පිරිවැය දරා නිබුණද රජයේ නක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 දෙසැම්බර් 01 දිනට වෙක්කයා මසුන් අභිජනනාගාරය රු. 144,316,000 ක් ලෙස හා කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනනාගාරය රු.129,010,000 ක් ලෙස නක්සේරු කර නිබුණි.

(ii) මෙම අභිජනනාගාරයන් සඳහා උපදේශන සේවාව යපයා නිබුණේ එකම පුද්ගලික ආයතනයකින් වන අතර ඒ සඳහා එම ආයතනයට රු.මී. 46 ක මුදලක් ගෙවා නිබුණද බිල්පත්හි කලවැඩ වටිනාකම සහනික කිරීම අධිකාරියේ ඉංජිනේරු ඒකකයක් නිසියදි එම උපදේශන සේවා ආයතනය විසින් සිදු කිරීම නිවැරදිද යන්න ගැටලුකාරී විය.

(iii) වෙක්කයා මසුන් අභිජනනාගාරය නිෂ්පාදන කටයුතු වෙනුවෙන් භාවිතා නොකිරීම නිසා, අභිජනනාගාරය ඉදිකිරීම් වෙනුවෙන් වැයවූ රු. 309,976,861 ක මුදල හා ඒ සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා දැරූ රු. 9,366,143 ක්වූ පුනරාවර්තන වියදම් නිෂ්කාර්ය වියදම් බවට පත්ව නිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී විදේශ ප්‍රදාන ලෙස අධිකාරිය වෙත ලැබී නිබුණුරු. 10,454,968 විදේශ ප්‍රදානවලින් අදාළ අරමුණු සඳහා රු. 878,423ක් එනම් සියයට 8.40 ක් පමණක් උපයෝජනය කර නිබුණි.

(ඓ) ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් රු.6,929,664 ක්වූ උපදේශන සේවා ගාස්තු ගෙවා නිබුණදඑම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එකී මුදල් නිෂ්කාර්ය වියදම් බවට පත්ව නිබුණි.

(ඔ) අවලංගු කරන ලද කොන්ත්‍රාත් දෙකක් සම්බන්ධයෙන් අධිකාරියට අයවිය යුතු රු.11,213,291 ක මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අයකර ගැනීමට කටයුතු කර නොනිබුණි.

(ක) රැකව අක්කර 42 ක ඉඩම් වපසරියක මඩ කකුළුවන් වගා කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අමාත්‍යාංශ අරමුදල් රු.මිලියන 221 ක් වැයකර ඉදිකිරීම් නිම කරන ලද පොකුණු හා ඒ ආශ්‍රිත ඉදිකිරීම්, ව්‍යාපෘතිය අසාර්ථක වීම මත කිවුල් දිය ඉස්සන් වගාව සඳහා පෞද්ගලික ආයෝජකයෙක් වෙත 2021 දෙසැම්බර් 02 දින 30 අවුරුදු කාලයකට බදුදී නිබුණි. 1998 අංක 53 දරන ජලජීවී වගා සංවර්ධන පනත අනුව රජයේ මුදල් වැය කරමින් ජලජීවී වගා මධ්‍යස්ථාන ඉදිකිරීමෙන් අනතුරුව පෞද්ගලික පාර්ශවයන් වෙත බදුදීම අධිකාරියේ මූලික කාර්යයක් නොවන අතර පනතින් ජලජීවී වගා ප්‍රවර්ධනය හා සුළු හා මධ්‍ය පරිමාණ ආයෝජන දිරි ගැන්වීම සඳහා පරමාණක් ප්‍රතිපාදන සලසා දී නිබුණි.

2019 මාර්තු 26 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2019 ප්‍රතිපාදන ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය සඳහා පුද්ගලික අංශය විසින් මුදල් යොදවා නොමැති බැවින් රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යවසායකත්ව ව්‍යාපෘතියක් ලෙස සැලකිය නොහැකි වුවද රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යවසායකත්ව ව්‍යාපෘතියක් ලෙස අභිලාෂ කැඳවා තිබුණි.

ඩබ්ලිව්.ඒ.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ආදායම් ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	සටහන	2022 වර්ෂය රු.	2021 වර්ෂය රු.
ආදායම	**03**	321,889,409.25	276,155,266
විකුණුම් පිරිවැය	**04**	(249,614,255.78)	(257,896,978)
දළ ලාභය		**72,275,153.47**	**18,258,289**
භාණ්ඩාගාර ප්‍රදාන- පුනරාවර්ථන ප්‍රදාන		556,136,000.00	493,067,000
පුනරාවර්ථන ස්වරූප වියදම් සඳහා යොදාගත්නා ලද ප්‍රාග්ධන ප්‍රදාන		2,521,540.45	23,978,524
වෙනත් ආදායම්	**05**	93,786,205.54	63,659,698
ජීව තොග අගය කිරීමේ ලාභ/(අලාභ)		83,570.00	(253,050.00)
අඩමාන ණය අධිවෙන්කිරීම		315,405.71	1,643,574
ශුද්ධ මෙහෙයුම් ආදායම		**725,117,875.17**	**600,354,035**
පරිපාලන වියදම්	**06**	(806,678,267.06)	(722,535,212)
බෙදාහැරීමේ වියදම්	**07**	(126,068,196.29)	(102,349,817)
මූල්‍ය වියදම්	**08**	(95,758.65)	(208,884)
ලාභ / (අලාභ) විලම්බිත ආදායම් ගැලපීමට පෙර		**(207,724,346.83)**	**(224,739,878)**
විවිධ ආදායම්		311,713,421.63	257,307,582
වර්ෂය තුල ලාභ / (අලාභ)		**103,989,074.80**	**32,567,704**

❖ සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් සහ 1 සිට 5 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ආදායම් විස්තීර්ණ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	සටහන	වර්ෂ 2022 රු.	වර්ෂ 2021 රු.
වර්ෂය තුල ලාභ / (අලාභ)		103,989,074.80	32,567,704.00
අනෙකුත් විස්තීර්ණ ආදායම්/වියදම් අය බදු			
අනෙකුත් විස්තීරණ අදායම් වර්ෂය සඳහා		0.00	0.00
මුළු විස්තීරණ අදායම් වර්ෂය සඳහා		**103,989,074.80**	**32,567,704.00**

සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 5දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2022 දෙසැම්බර් 31 දිනට

	සටහන	2022 වර්ෂය රු.	2021 වර්ෂය රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	9	2,869,058,400.23	2,376,053,356
අභිජනන හා වෙළඳ වත්කම්	10	955,603,017.68	993,956,149
ජීව වත්කම්	11	18,701,976.00	16,539,296
කෙරිගෙන යන වැඩ	12	12,915,256.43	537,882,828
අනෙකුත් ජංගම නොවන වත්කම්	13	221,719,566.45	221,719,566
		4,077,998,216.79	4,146,151,196.00
අස්පෘශ්‍ය වත්කම්			
මෘදුකාංග	14	7,951,142.02	3,317,198.73
		7,951,142.02	3,317,198.73
ජංගම වත්කම්			
තොගය	15	92,279,004.54	75,315,329
නැන්පත්, අත්තිකාරම් හා කලින් ගෙවීම්	16	12,949,488.06	5,422,545
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	17	151,414,313.92	130,223,573
අතැති මුදල් සහ බැංකුවේ මුදල්	18	194,093,395.56	127,999,387
		450,736,202.08	338,960,833
මුළු වත්කම්		4,536,685,560.89	4,488,429,227.68
ස්කන්ධය			
ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රාග්ධන ප්‍රදාන		(31,341,702.18)	528,878,007
රඳවාගත් ඉපැයීම්		(9,480,793.66)	- 132,751,688
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත		17,400,000.00	17,400,000
මුළු ස්කන්ධය		(23,422,495.84)	413,526,320
බැරකම්			
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	19	155,126,561.43	151,112,102
විලම්බිත ආදායම්	20	3,852,483,337.88	3,617,995,963
රාජ්‍ය ප්‍රදාන	21	54,040,042.00	54,040,042
බදු ආදායම් අත්හිටුවීමේ ගිණුම - ඍණ ව්‍යාපෘතිය		221,719,566.45	-
		4,283,369,507.76	3,823,148,107
ජංගම බැරකම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	22	222,305,576.30	174,616,904
කොන්ත්‍රාත් මත රඳවා ගැනීම්		54,432,972.67	77,137,897
		276,738,548.97	251,754,801
මුළු බැරකම්		4,560,108,056.73	4,074,902,908
මුළු ස්කන්ධය හා බැරකම්		4,536,685,560.89	4,488,429,228

සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 5 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි.

.....
ඒ .එච්. එන්. යස්මීනා
නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල්

.....
ආචාර්ය ජේ.එම්. අශෝකා
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....
කී විජයරත්න
සභාපති

.....
ටී ඊ ඩී ධම්මික ප්‍රේමරත්න
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	සටහන	පුනරාවර්ථන ප්‍රදාන රු.	ප්‍රාග්ධන ප්‍රදාන රු.	වත්කම් ප්‍රත්‍යාගණන රු.	රඳවාගත් ඉපැයීම් රු.	එකතුව රු.
2021 ජනවාරි 01 දිනට ශේෂය		-	178,248,258.92	17,400,000.00	(174,255,505.91)	21,392,753.01
කාලපරිච්ඡේදයට ලද ප්‍රදාන - පුනරාවර්ථන/ප්‍රාග්ධන		493,067,000.00	50,167,000.00	-	-	543,234,000.00
ප්‍රාග්ධනීත වත්කම් සඳහා භාවිතා කල අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		-	657,935,575.86	-	-	657,935,575.86
ප්‍රවර්ථන වර්ෂයේ විලම්බිත ආදයම් මාරු කිරීම-ප්‍රාග්ධන (වත්කම් එකතුකිරීම)	10	-	(22,919,004.33)	-	-	(22,919,004.33)
ප්‍රවර්ථන වර්ෂයේ විලම්බිත ආදයම් මාරු කිරීම-ප්‍රාග්ධන (ඉදිකිරීම්)	Sch-01	-	(20,451,222.30)	-	-	(20,451,222.30)
ප්‍රවර්ථන වර්ෂයේ විලම්බිත ආදයම් මාරු කිරීම-අමාත්‍යාංශ ප්‍රාග්ධන (ඉදිකිරීම්)	Sch-01	-	(293,618,779.97)	-	-	(293,618,779.97)
පුනරාවර්ථන ප්‍රදාන ලාභාලාභ ගිණුමට මාරු කිරීම		(493,067,000.00)	-	-	-	(493,067,000.00)
ප්‍රාග්ධන නොවන වියදම් සඳහා දරණ ලද ප්‍රාග්ධන ප්‍රදාන		-	(23,978,523.82)	-	-	(23,978,523.82)
පෙර වර්ෂ ගැලපුම්		-	3,494,703.11	-	8,936,114.27	12,430,817.38
කාලපරිච්ඡේදයට අදාල ලාභය/(අලාභය)		-	-	-	32,567,704.00	32,567,704.00
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		-	528,878,007.47	17,400,000.00	(132,751,687.64)	413,526,319.83
2022 ජනවාරි 01 දිනට ශේෂය		-	528,878,007.47	17,400,000.00	(132,751,687.64)	413,526,319.83
කාලපරිච්ඡේදයට ලද ප්‍රදාන - පුනරාවර්ථන/ප්‍රාග්ධන	Sch-07	556,136,000.00	10,000,000.00	-	-	566,136,000.00
ප්‍රාග්ධනීත වත්කම් සඳහා භාවිතා කල අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		-	141,977,977.20	-	-	141,977,977.20
ප්‍රවර්ථන වර්ෂයේ විලම්බිත ආදයම් මාරු කිරීම-ප්‍රාග්ධන (වත්කම් එකතුකිරීම)		-	(6,723,158.53)	-	-	(6,723,158.53)
ප්‍රවර්ථන වර්ෂයේ විලම්බිත ආදයම් මාරු කිරීම-ප්‍රාග්ධන (ඉදිකිරීම්)		-	0.00	-	-	0.00
ප්‍රවර්ථන වර්ෂයේ විලම්බිත ආදයම් මාරු කිරීම-අමාත්‍යාංශ ප්‍රාග්ධන (ඉදිකිරීම්)	Sch-01	-	(691,301,670.29)	-	-	(691,301,670.29)
පුනරාවර්ථන ප්‍රදාන ලාභාලාභ ගිණුමට මාරු කිරීම		(556,136,000.00)	0.00	-	-	(556,136,000.00)
ප්‍රාග්ධන නොවන වියදම් සඳහා දරණ ලද ප්‍රාග්ධන ප්‍රදාන		-	(2,521,540.45)	-	-	(2,521,540.45)
පෙර වර්ෂ ගැලපුම්		-	(11,651,317.58)	-	19,281,819.18	7,630,501.60
කාලපරිච්ඡේදයට අදාල ලාභය/(අලාභය)		-	0.00	-	103,989,074.80	103,989,074.80
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		-	(31,341,702.18)	17,400,000.00	(9,480,793.66)	(23,422,495.84)

සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 7දක්වා ඇති උපලේඛන මෙම මුද්‍රිත ප්‍රකාශනයෙහි නොඇතුළත්.

** තක්ෂණික අවශ්‍යතා සම්පාදනය කිරීමෙන් ඇත්තෙන් 2012 වර්ෂයේ තක්ෂණික කල ඉඩම් වලහන (කලාපවල හා කොළඹ මධ්‍යස්ථානය) තක්ෂණික වටිනාකම් වේ.*

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	සටහන	2022 වර්ෂය රු.	2021 වර්ෂය රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය			
ලැබීම්			
මාළු බීජ විකිණීම		265,136,766.75	207,297,121.10
භාණ්ඩාගාර ප්‍රදාන පුනරාවර්තන		556,136,000.00	493,067,000.00
වෙනත් ආදායම්		86,434,870.74	59,484,626.83
අමාත්‍යාංශ හා වෙනත් ලැබීම්		0.00	593,227,216.47
විදේශ ප්‍රදාන		10,478,968.25	0.00
ණයගැතියන්ගෙන් නැවත ලබා ගැනීම් සහ වෙනත් ලැබීම්		44,110,764.29	132,471,712.71
		962,297,370.03	1,485,547,677.11
ගෙවීම්			
පරිපාලන වියදම්		(213,313,300.20)	(209,287,444.32)
විශ්‍රාම පාරිතෝෂික		(5,781,292.60)	(7,135,879.70)
වෙනත්		(202,571,936.14)	(766,407,308.48)
අමාත්‍යාංශ හා වෙනත් ප්‍රදාන ව්‍යාපෘති හා වෙනත් ගෙවීම් සඳහා භාවිතා කිරීම		(483,361,444.30)	(872,226,697.11)
ව්‍යාපෘති සහ වෙනත් ගෙවීම් සඳහා භාවිතා කරන විදේශ ප්‍රදානයන්		(562,645.00)	0.00
		(905,590,618.24)	(1,855,057,329.61)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය		56,706,751.79	(369,509,652.50)
ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ මිලට ගැනුම්		(7,169,334.26)	(3,072,392.51)
ප්‍රාග්ධනිත වත්කම් හා අනෙකුත් ව්‍යාපෘති - අමාත්‍යාංශ ප්‍රදාන		(797,990,230.64)	(627,675,521.20)
ප්‍රාග්ධනිත වත්කම් (සෘජු භාණ්ඩාගාර ප්‍රාග්ධන ලැබීම්)ජ.ව.සං.අ.		0.00	(10,442,126.15)
රඳවා තබා ගැනීම නිදහස් කිරීම		(20,273,826.79)	(8,228,154.05)
ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය		(825,433,391.69)	(649,418,193.91)
මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය			
භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන		10,000,000.00	50,167,000.00
ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් (අමාත්‍යාංශ ප්‍රදාන)		824,820,648.92	998,929,997.31
මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය		834,820,648.92	1,049,096,997.31
මුදල්, මුදල් හා සමාන අයිතමයන්ගේ වූ ශුද්ධ වැඩිවීම් / අඩුවීම්		66,094,009.02	30,169,150.90
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනස		0.00	741,946.33
වර්ෂ ආරම්භක මුදල් හා මුදල් හා සමාන අයිතමයන්ගේ වටිනාකම		127,999,386.54	97,088,289.31
වර්ෂ අවසාන මුදල් හා මුදල් හා සමාන අයිතමයන්ගේ වටිනාකම		194,093,395.56	127,999,386.54
මුදල්, මුදල් හා සමාන අයිතමයන්ගේ විශ්ලේෂණය			
වර්ෂ අවසානයට			
බැංකු ශේෂය (බැංකුවේ ඇති මුදල්)		194,092,795.06	127,999,001.54
මුදල් ශේෂය (අතැති මුදල්)		600.50	385.00
		194,093,395.56	127,999,386.54

සටහන් අංක 1 සිට 21 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් සටහන් සහ 1 සිට 5 දක්වා ඇති උපලේඛන මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසකි.

N-1: PY ගැලපුම් යනු ආදායම් ගිණුමට වැරදි ලෙස බැර කරන ලද පෙර වසරවල ණයගැති එකතුව නිවැරදි කිරීමේ මුදලයි.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සංස්ථාපනය කිරීමේ තොරතුරු

1.1 පොදු කරුණු

1998 අංක 53 දරණ පනතින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර ඇති අතර ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නියමයන්ට යටත් වේ. අධිකාරියේ ප්‍රධාන කාර්යාලය 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටුවා ඇත.

1.2 ප්‍රධාන කර්තව්‍ය හා මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුල අධිකාරියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ,

- මත්ස්‍ය නිෂ්පාදනය හා මාළු පරිභෝජනය ඉහළ නැංවීම සඳහා ජලජීවී වගාව හා ජලජීවී කටයුතු සංවර්ධනය කිරීම.
- මිරිදිය හා වෙරළ ආශ්‍රිත ජලජීවී වගාව සංවර්ධනය කිරීම තුලින් රැකියා අවස්ථා නිර්මාණය කිරීම.
- අපනයනය සඳහා විසිතුරු මසුන් ඇතුළු ඉහළ වටිනාකමින් යුත් විශේෂ වල ගොවිතැන ප්‍රවර්ධනය කිරීම.
- පරිසර හිතකාමී ජලජීවී භාවිතය තුලින් ජලජ සම්පත් ප්‍රශස්තව උපයෝගී කරගැනීම.
- කුඩා, මධ්‍ය පරිමාණ හා විශාල පරිමාණ පුද්ගලික අංශයේ ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම හා ස්ථාපනය කිරීම.
- දුර්වල ජලජීවී වගාවන් මගින් විනාශයට පත් ජලජ සම්පත් සංරක්ෂණය හා පුනරුත්ථාපනය කිරීම.

1.3 නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන දිනය

අලුතින් සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතියේ හෝ නීතියේ, පූර්ණ හෝ කොටසක් සම්මත කර ගැනීමට අධිකාරිය බැඳෙන තෙක් හෝ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තෙක් මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 2017/01/01 දින සිට තවදුරටත් වලංගුවේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරංශය

2.1 මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමේ පදනම

මෙම ගිණුම් වර්තා පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මත වේ. කාලපරිච්ඡේදයේ තක්සේරු කිරීමේදී පිළිබිඹු වන උද්ධමන වත්කම් සඳහා කිසිදු ගැලපීමක් සිදු නොකෙරේ.

2.2 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරන ලද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන වලට අනුකූලව වේ.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ බැංකුවෙහි ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින්ය.

2.4 සංසන්දනාත්මක තොරතුරු

අධිකාරිය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් නිශ්චිතවම අඛණ්ඩව භාවිතා කර ඇති අතර, වෙනත් ආකාරයකින් ප්‍රකාශිත නැත්නම් පෙර වර්ෂයේ භාවිතා කළ ඒවා සමඟ අනුකූල වේ.

2.5 ප්‍රමාණාත්මකතාවය සහ සමාහරණය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රමාණාත්මකව සමාන අයිතමයන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇත. අසමාන අයිතමයන් ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය අනුව, ප්‍රමාණාත්මක නම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් පියවා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන්හි ශුද්ධ මුදල් ප්‍රමාණය වාර්තා කර ඇත, එනම් එම හදුනාගත් අගය හිලව් කිරීමට නීත්‍යානුකූලව බලයක් ඇති විට හා එහි අභිප්‍රාය වන්නේ ශුද්ධ පදනම මත පියවීමට හෝ වත්කම් සාක්ෂාත් කර ගැනීමට සහ වගකීම එකවර පියවීමට වේ.

කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක හෝ අර්ථකථනයක අවශ්‍යතාවයක් හෝ අවසර දී ඇති සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂයෙන් අනාවරණය කර නොමැති නම් ආදායම් ප්‍රකාශයේ ආදායම සහ වියදම් හිලව් නොකර පෙන්වා ඇත.

2.6 ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රදාන

මූල්‍ය නොවන ප්‍රදාන ඇතුළුව රජයේ ප්‍රදාන සාධාරණ සහතිකයක් ඇති විට "ආදායම් ප්‍රවේශය" මත පදනම් ව සාධාරණ වටිනාකමකින් හදුනාගෙන ඇත.

(අ) ආයතනය ඒවාට අනුයුක්ත කරන කොන්දේසි වලට අනුකූල වේ ; හා

(ආ) ප්‍රදාන ලැබෙනු ඇත.

රාජ්‍ය ප්‍රදානය මුදල් වශයෙන් නැතහොත් රජයට වගකීමක් / ණයක් අඩු කිරීමක් ලෙස ලැබුණද රජයේ ප්‍රදාන එකම ක්‍රමවේදයට ගිණුම්ගත කර ඇත.

රජයේ ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් මත කාල සීමාවන් තුළ දී ලාභ හෝ අලාභ ලෙස ප්‍රදානයන්ට අදාල වියදම්, එහි වියදම් ලෙස හඳුනාගෙන ඇත. ක්ෂය කළ හැකි වත්කම්වලට අදාල ප්‍රදාන, එම වත්කම්වල ක්ෂයවීම් වියදම් අදාල කාල සීමාවන් තුළ ලාභයට හෝ අලාභයට හඳුනා ගනු ලැබේ.

2.7 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

බොල්ණය සහ අඩමාන ණය සඳහා වෙන් කිරීමෙන් පසු ඇස්තමේන්තු ශුද්ධ ඉපැයීම් වටිනාකම වෙළඳ මත ලැබිය යුතු දෑ ලෙස සඳහන් වේ. වෙනත් ලැබීම් පිරිවැයට හඳුනාගෙන ඇත.

2.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.-2) අනුකූලව "සෘජු ක්‍රමය" භාවිතා කර සකස් කර ඇත.

මුදල් හා මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ ලෙස අර්ථ දක්වා ඇත්තේ අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල් වේ.

2.9 දේපල, පිරියත හා උපකරණ

2.9.1 ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත අයිතිය මාරු නොකරන ලද නමුත් අභිජනන මෙහෙයුම් සඳහා භාවිත කරන ඉඩම් 15 කි. ඒවා පහත පරිදි වේ,

i. වෙස්ටදෝ වත්ත – නුවරඑළිය

ii පම්බල – පහළවත්ත

iii. මිරිදිය අභිජනන මධ්‍යස්ථානය - කහඳමෝදර

iv. දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය - බිංගිරිය

v. මඩකලපුව දිස්ත්‍රික්කයේ වඩ්ඩාවන් ගම්මානයේ වාකරේ ආදර්ශ ඉස්සන් ගොවිපල

vi. මුලතිව් වලිඤ්ඤන් මාම් මුලන්නාවිල්

vii. යාපනය – චුල්ලිපුරම් බටහිර

viii. මන්නාරම් – සායක්කුලි මුසලි

ix. දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය - පොළොන්නරුව

x මිරිදිය අභිජනන මධ්‍යස්ථානය - කල්ලරාව - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

xi වව්නියාව

xii කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නාරමඩු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් පිහිටුවීමට යෝජිත ඉඩම

xiii වරල් මත්ස්‍ය අභිජනනාගාරය - මඩකලපුව

xiv. පුදුකුඩිඉරිප්පු ඉස්සන් අභිජනනාගාරය, මඩකලපුව දිස්ත්‍රික්කය

xv මුලතිව් දිස්ත්‍රික්කයේ මුතියන්කට්ටු ගම්මානයේ කුඩා පරිමාණයේ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් සඳහා ඉඩම ලබාදී ඇත

2.9.2 සියලුම ඉඩම් විස්තර තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යවනු ලැබේ. පහත සඳහන් ඉඩම් තක්සේරු වාර්තා පමණක් ලැබී ඇති අතර ඉඩම් කාණ්ඩයට අයත් සියලුම ඉඩම්වල තක්සේරු මුදල නොලැබීම හේතුවෙන් 2022 ගිණුම්වල ගිණුම්ගත කර නොමැත.

i. දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, මොනරාගල - තක්සේරු මුදල 26,900,000.00 (ඉඩම් සහ ගොඩනැඟිල්ල)

ii දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, අම්පාර - තක්සේරු මුදල 15,000,000.00 (ඉඩම්)

iii. ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය, කිලිනොච්චිය - තක්සේරු මුදල 45,950,000.00 (ඉඩම්)

iv. දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, බිංගිරිය - තක්සේරු මුදල 7,000,000.00 (ඉඩම්-2014)

ඉඩම් හැර අනෙකුත් සියලුම වත්කම් පිරිවැයෙන් සම්මුව්චිත ක්ෂය අඩුකිරීමෙන් පසු ශුද්ධ වටිනාකම පෙන්නුම් කර ඇත.

වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පුරාවට සරල මාර්ගික ක්‍රමයට ක්ෂය වීම ගණනය කරනු ලැබේ. ක්ෂය කිරීම් අනුපාතය පහත පරිදි වේ.

ගොඩනැගිලි හා ඉදිකිරීම්	4%
වාහන	20%
ලී බඩු හා කාර්යාලීය උපකරණ	10%
රසායනාගාර උපකරණ	10%
යාන්ත්‍රික හා වෙනත් උපකරණ	10%
රක්නාගාර	10%
මාලු ටැංකි	10%
මාලු තටාක	6%
උපකරණ හා උපාංග	10%
පරිඝණක හා සංනිවේදන හුවමාරු උපකරණ	20%
පරිඝණක මෘදුකාංග	10%

සටහන - රසායනාගාර උපකරණ සහ පරිගණක මෘදුකාංග ක්ෂයවීමේ අනුපාතය වත්කම් වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලය හදුනාගෙන ඇති අතර තාක්ෂණික යල්පැනයාම නොසලකා හැරේ.

2.10 අඩමානණය

සැක සහිත ණය ගැනියන් සම්බන්ධයෙන් වසර පහක (05) කාලය තුළ ණයගැති ශේෂය සඳහා 10% ක් සහ වසර පහකට (05) වැඩි කාලයක් පවතින ණයගැති ශේෂයන් සඳහා සම්පූර්ණයෙන් අඩමානණය ලෙස ප්‍රතිපාදන ලබා දී ඇත. වසර තුළ අඩමාන ණය අධි/ඌණ වෙන්කිරීම ලාභාලාභ ගිණුමට ගලපා ඇත.

2.11 ජීව විද්‍යාත්මක තොග

- වර්ෂය තුල මත්ස්‍ය බීජ, විසිතුරු මත්ස්‍ය, සහ මිරිදිය ඉස්සන් හා ඉස්සන් විතුණුම් වටිනාකම (සාධාරණ වටිනාකම) හෝ ශුද්ධ උපලබ්දී අගය යන දෙකෙහි අඩු වටිනාකමට ගණනය කර ඇත.
- මව් මසුන් තොග (ආහාර මාළු) ඔවුන්ගේ මස් බර සහ මස් විකුණුම් (සාධාරණ) වටිනාකම මත (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.-18 - කෘෂිකර්මයේ 34 වගන්තියට අනුව) සාධාරණ වටිනාකමින් සමුච්චිත ක්ෂය අඩුකිරීම නිවැරදි ගණනය කිරීමක් නොවන බව හා මව් මසුන් සඳහාම වෙළඳපල වටිනාකමක් ද නොමැත.

2.12 විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ

ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම - පාරිතෝෂික

සේවයේ ආරම්භක දින සිට එක් එක් සේවා වසර වෙනුවෙන් මාසික වැටුපෙන් ½ දීමනාවක් පාරිතෝෂික ලෙස වෙන්කර ඇත.

කෙසේ වෙතත්,1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව, සේවකයකු පාරිතෝෂිකයක් ලැබීම සඳහා බැඳෙනුයේ අධිකාරියේ අඛණ්ඩව වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුවය.

දායකත්ව සැලැස්ම අර්ථ දැක්වීම– සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා අදාළ වන ව්‍යවස්ථාවන් හා රෙගුලාසි වලට අනුකූලව සේවකයින් සුදුසුකම් ලබයි. අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත සේවකයින්ගේ දළ වැටුපෙන් පිළිවෙළින් 15% ක සහ 3% ක දායකත්වයක් ලබා දෙයි.

2.13 වියදම් හඳුනා ගැනීම

වියදම්, පිරිවැය හා උපයනු ලබන ආදායම අතර සෘජු සම්බන්ධතාවයක් මත ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ. නිෂ්පාදනය පවත්වා ගෙන යාම සහ දේපල, යන්ත්‍රෝපකරණ කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා දරණ ලද මුළු වියදම ආදායමට ගලපා කාලපරිජේදයට අදාල ලාභය/(අලාභය) ගණනය කර ඇත.

2.14 ආදායම මැනීම

ආර්ථික ප්‍රතිලාභ අධිකාරියට හෝ ශ්‍රී ලංකා රජයට ගලා ඒමේ සම්භාවිතාව අනුව පුළුල් ලෙස ආදායම හඳුනාගෙන ඇති අතර ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ආදායම හඳුනා ගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායක ද සපුරාලිය යුතුය.

2.14.1 භාණ්ඩ විකිණීම

පහත සඳහන් සියලු කොන්දේසි සපුරා ඇති විට භාණ්ඩ අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනා ගත යුතුය.

i) ආයතනය විසින් භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම සහ විපාක ගැනුම්කරු වෙත පවරා ඇත;

ii) ආයතනය සාමාන්‍යයෙන් හිමිකාරිත්වය හා සම්බන්ධ මට්ටමකට අඛණ්ඩ කළමනාකරණ මැදිහත්වීමක් හෝ විකුණන ලද භාණ්ඩ කෙරෙහි ඵලදායී පාලනයක් තබා නොගනී;

iii) ආදායම් ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම;

iv) ගනුදෙනුව හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයන් ආයතනයට / හෝ ශ්‍රී ලංකා රජයට ගලා ඒමට ඉඩ ඇතිවිට; සහ

v) ගනුදෙනුව සම්බන්ධයෙන් දරන ලද හෝ දැරීමට නියමිත පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම.

14.2.2 සේවා ආදායම

සේවා සැපයීම සම්බන්ධ ගනුදෙනුවක ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි විට, වාර්තා කරන දිනට අවසන් වන අදියර දක්වා හඳුනාගෙන ඇති සේවාවලින් ලැබෙන ආදායම;

i) ආදායම් ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම;

ii) ගනුදෙනුව හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය ආයතනය වෙත ගලා ඒමට ඉඩ ඇතිවිට;

iii) වාර්තා කරන දිනයේ ගනුදෙනුව අවසන් කිරීමේ අදියර විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම; සහ

iv) ගනුදෙනුව සඳහා දරන ලද පිරිවැය සහ ගනුදෙනුව සම්පූර්ණ කිරීම සඳහා වන පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම.

14.2.3 ගාස්තු, බලපත්‍ර ගාස්තු, දඩ ගාස්තු, පොලී, නිෂ්පාදන භාග සහ ලාභාංශ

ආදායම හඳුනාගත් විට;

i) ගනුදෙනුව හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය ආයතනය වෙත ගලා ඒමට ඉඩ ඇතිවිට; සහ

ii) ආදායම් ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම.

iii) ගෙවීම් ලැබුණු විට ගාස්තු / බලපත්‍ර ගාස්තු / දඩ ගාස්තු හඳුනා ගැනේ.

iv) වත්කම්වල ඵලදායී කාවය සැලකිල්ලට ගන්නා, කාල අනුපාතික පදනමක් මත පොලී හඳුනාගත යුතුය;

v) අදාළ ගිවිසුම්වලට අනුකූලව උපයා ගන්නා දෙය ලෙස නිෂ්පාදනභාග මුදල් හඳුනාගත යුතුය;

vi) ලාභාංශ හෝ ඒවාට සමාන මුදල් ගෙවීම් ලබා ගැනීමට ආයතනයට ඇති අයිතිය තහවුරු කරන විට හඳුනා ගැනේ.

		31/12/2022 රු.	31/12/2021 රු.
03	**ඉපැයීම්**		
6301- 1 ණයට විකුණුම් (මත්ස්‍ය බීජ)		33,811,288.50	54,556,324.50
6301- 1 අත්පිට විකුණුම් (මත්ස්‍ය බීජ)		288,078,120.75	221,598,941.70
එකතුව		**321,889,409.25**	**276,155,266.20**
04	**විකුණුම් පිරිවැය**		
01.01 දිනට තොගය			
	මත්ස්‍ය බීජ	3,823,435.00	12,003,600.00
		3,823,435.00	12,003,600.00
එකතු කලා - සෘජු වියදම්			
2105	මවු මසුන් වැඩිදියුණු කිරීම	5,663,225.26	13,093,981.10
	මව් මත්ස්‍ය ආගණනය	(1,200,553.00)	1,862,453.50
මත්ස්‍ය බීජ පරිභෝජනය			
	ඉදිරියට ගෙන ආ ශේෂය 01.01	24,571,396.78	4,555,467.28
1304	එකතු කලා-මිලදී ගැනීම්	82,636,064.19	104,559,425.80
3102	අඩුකලා - 12.31දිනට තොගය	(13,415,584.81)	(24,571,396.78)
1304		93,791,876.16	84,543,496.30
හෝර්මෝන, රසායනික ද්‍රව්‍ය, ඔක්සිජන්			
	ඉදිරියට ගෙන ආ ශේෂය 01.01	16,258,929.76	9,385,031.26
1305	එකතු කලා-මිලදී ගැනීම්	31,819,438.47	18,060,653.02
3103	අඩුකලා - තොගය 12.31 දිනට	(29,029,486.82)	(16,258,929.76)
1305		19,048,881.41	11,186,754.52
එකතු කලා : අභිජනන පොදු වියදම්			
1504	විදුලිය හා ජල පිරිවැය 60%	13,546,705.91	14,300,944.38
1507	ආරක්ෂක සේවාවන් 50%	24,068,233.81	22,247,689.35
1403	යන්ත්‍රසූත්‍ර හා පිරියත සුළු අලුත්වැඩියා කටයුතු	5,680,836.94	3,988,884.26
2102B	යන්ත්‍රසූත්‍ර හා පිරියත නඩත්තු වියදම්	-	1,954,010.37
1708	ක්ෂය ගිණුම් - මිලදී ගැනීම්	108,323,764.29	96,538,598.90
		151,619,540.95	139,030,127.26
අඩුකලා - 12.31 දිනට තොගය			
	මත්ස්‍ය බීජ	(23,132,150.00)	(3,823,435.00)
		(23,132,150.00)	(3,823,435.00)
එකතුව		**249,614,255.78**	**257,896,977.68**

සටහන

1) NAQDA මත්ස්‍ය බීජ විකුණුම් මිල පදනම් කර ගෙන ගණනය කර ඇත. .

2) 2020 වර්ෂය සිට, NAQDA විසින් 34 වගන්තිය යටතේ ජීව විද්‍යාත්මක වත්කම් සඳහා නියම කර ඇති ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.-18 කෘෂිකාර්මික සහ ප්‍රතිකාර ක්‍රම අනුගමනය කර ඇත.

05 වෙනත් ආදායම්

6303	සංචාරක බංගලා ආදායම	1,544,425.00	388,500.00
6304	වෙනත් ආදායම්	5,980,615.22	5,952,221.02
6305	නිවාස කුලී	408,070.96	397,390.11
6306	ටෙන්ඩර් තැන්පතු	609,550.00	2,005,929.50
6309	ආපදා ණය පොලී	2,435,143.64	2,314,930.02
6310	පාපැදි ණය පොලී	11,926.56	16,686.80
6312	විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන් ආදායම	7,091,570.00	9,221,972.00
6313	ජලජීවී බලපත්‍ර ආදායම	8,513,516.00	9,168,127.90
6315	කලාවැව මධ්‍යස්ථානයේ ලැබෙන කුලී ආදායම	11,820,412.79	4,176,009.85
6316	දඩ	1,906,340.80	4,039,662.94
6317	මත්ස්‍ය ඇගිල්ලන් ප්‍රවාහන ආදායම	30,595,771.22	14,368,506.00
6318	රසායනාගාර පරීක්ෂණ ආදායම්	11,477,350.00	8,335,676.00
6319	ධීවර හැඳුනුම්පත් ආදායම්	17,084.00	11,560.00
6320	ක්ෂේත්‍ර පිරික්සුම් ආදායම්	122,000.00	35,400.00
6321	ආදායම් රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව	5,500,000.00	1,690,000.00
6322	පොත් ණය පොලී ආදායම්	7,896.00	5,586.00
6323	බැංකු පොළී (ලංකා බැංකුවේ ගිණුම් අංකය-858861	4,775,014.08	984,191.69
6324	මත්ස්‍ය පෝෂණ පුහුණු වැඩසටහන්	412,500.00	52,500.00
6404	ආසියානු සංවර්ධන බැංකුව - මිනිහැවරී ණය වාරික	100,000.00	150,000.00
	එකතු කළ අගය මත බද්ද අධි වෙන්කිරීම	457,019.27	344,848.56
එකතුව		**93,786,205.54**	**63,659,698.39**

සටහන - බැංකු පොලී ආදායම වන්නෙ නියමු ව්‍යාපෘතියක් ලෙස "දිවිනැගුම" ගිණුම් ශේෂ සඳහා විවෘත කරන ලද overnight call deposit මත ලද පොළී ආදායම වේ.

06 පරිපාලන වියදම්

06.1 සේවක පාරිශ්‍රමික

1101	වැටුප් හා වෙනත් දීමනා	300,810,510.55	278,586,661.92
1102	අතිකාල හා නිවාඩු දින දීමනා	35,018,260.40	40,142,132.64
1103	වෙනත් දීමනා	99,194,432.32	69,183,085.37
1104	සේවක අර්ථසාධක මුදල් දායකත්වය	52,584,666.69	52,846,962.90
1105	සේවක භාරකාර අරමුදල් දායකත්වය	10,520,298.56	10,243,260.63
1302-C	NAQDA කාර්ය මණ්ඩලය සඳහා ඉන්ධන දීමනා	3,274,269.34	-
1501-B	දෙපාර්තමේන්තු ප්‍රධානියා සඳහා ප්‍රවාහන දීමනාව	1,100,000.00	-
1502-B	දුරකථන වියදම්	784,412.23	-
1307	නිල ඇඳුම් සඳහා දීමනා	575,115.00	193,299.00
1516	සේවක සුභසාධක වියදම්	3,458,872.66	3,117,721.45
1701	පාරිතෝෂික වෙන්කිරීම	10,820,834.35	13,593,153.73
		518,141,672.10	467,906,277.64

06.2 සන්නිවේදන

1502	දුරකථන, ටෙලෙක්ස් පණිවිඩ හා ෆැක්ස් වියදම්	4,251,822.16	4,338,400.54
1503	තැපැල් හා විදුලි පණිවුඩ වියදම්	1,186,963.93	773,147.13
		5,438,786.09	5,111,547.67

06.3		**අලුත්වැඩියා හා නඩත්තු වියදම්**		
	1402	කාර්යාල සහ ගොඩනැගිලි සහ සුළු අලුත්වැඩියා සඳහ	4,945,980.84	5,366,728.16
	1404	කාර්යාල උපකරණ සහ සුළු අලුත්වැඩියා සඳහා	3,212,237.65	2,903,303.11
	1705	ස්ථාවර වත්කම් ක්ෂය	119,535,896.16	107,503,296.95
			127,694,114.65	115,773,328.22
06.4		**කාර්යාල පරිශ්‍රය නඩත්තු වියදම්**		
	1505	කාර්යාල බදු කුලී සඳහා	5,467,374.90	2,872,046.60
	1506	වරිපනම්	56,516.86	266,664.22
	1508	කාර්යාල පවිත්‍රතා වියදම්	5,685,704.50	5,378,385.95
	1504A	විදුලි ගාස්තු	8,012,969.71	7,155,498.66
	1504B	ජල ගාස්තු	1,018,167.57	977,569.03
			20,240,733.54	16,650,164.46
06.5		**වෙනත් වියදම්**		
	1515	විගණන ගාස්තු	879,000.00	879,000.00
	1507	ආරක්ෂක සේවා ගාස්තු	24,068,233.80	22,247,689.35
	1510	වෙළෙඳ දැන්වීම්	3,306,498.94	5,270,842.80
	1306	පුවත්පත් සහ සඟරා	269,510.40	183,190.00
	1501	ප්‍රවාහන වියදම්	673,148.71	1,974,371.15
	1301	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	7,793,475.71	6,258,750.51
	1513	මුද්‍රණ වියදම්	-	94,083.40
	1201	ගමන් වියදම් (දේශීය)	21,012,312.92	22,118,322.07
	1511	සංග්‍රහ වියදම්	947,146.53	917,805.37
	1514	අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	491,650.00	569,500.00
	1405	රසායනාගාර උපකරණ	527,566.00	677,885.00
	1303	යාන්ත්‍රික සහ විද්‍යුත් භාණ්ඩ	680,709.99	554,131.00
	1512	වෙනත් ගිවිසුම්ගත සේවා	21,783,925.83	12,490,667.33
	1520	කලාවැව මධ්‍යස්ථානයේ ලැබෙන කුලී ආදායම	7,290,297.10	2,758,716.90
	1522	නීති සහ ඒ හා සමාන වියදම්	1,113,320.00	1,838,542.00
	1519	විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන් ආදායම	3,820,364.00	3,712,429.90
	1524	කල්බදු කුලී (මෙහෙයුම්)	3,399,866.00	2,572,560.00
	1525	ශ්‍රම ගාස්තු (බාහිර)	33,900,056.50	29,312,031.50
	2201-B	තොරතුරු තාක්ෂණික සේවා	2,982,428.25	2,573,855.85
	1526	මත්ස්‍ය පෝෂණ වැඩසටහන් වියදම්	223,450.00	89,520.00
			135,162,960.68	117,093,894.13
	එකතුව		**806,678,267.06**	**722,535,212.12**

07 බෙදාහැරීමේ වියදම්

1302	රථ වාහන ධාවන වියදම්	28,877,589.47	24,105,832.31
1302B	මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රවාහන වියදම්	25,233,644.00	10,175,255.00
1401	ප්‍රධාන රථ වාහන සහ සුළු අලුත්වැඩියා වියදම්	21,518,554.32	21,881,293.16
1513-B	ඩීවර හැඳුනුම්පත්	-	3,628.00
2103C	රථ වාහන නඩත්තු වියදම්	1,249,450.00	2,111,917.39
1523	රථ වාහන රක්ෂණ වියදම්	1,132,929.72	888,574.83
2106	ජලජීවී වගා සංවර්ධනය	-	3,425,587.32
2108	ප්‍රදර්ශන වියදම්	-	410,845.00
2107	නීති විරෝධී ධීවර කටයුතු වැටලීම්	6,704,577.00	439,624.00
2111	පරීක්ෂණ කට්ටල	18,000,159.00	11,846,714.60
2109	පුහුණු වැඩසටහන් දේශීය සහ විදේශීය	700,714.60	1,546,671.70
1521	වාහන බලපත්‍ර සහ දුම් පරීක්ෂණ ගාස්තු	727,095.00	733,110.00
1706	රථ වාහන ක්ෂය	21,923,483.18	24,534,763.96
	බොල් ණය කපා හැරීම්	-	246,000.00
එකතුව		**126,068,196.29**	**102,349,817.27**

08 මූල්‍ය වියදම්

1601	බැංකු ගාස්තු	95,758.65	208,883.60
එකතුව		**95,758.65**	**208,883.60**

09 දේපල හා පිරියක උපකරණ

		ඉඩම්	ගොඩනැගිලි හා ඉදිකිරීම්	ලීසිඩු හා කාර්යාලීය උපකරණ	රසායනාගාර උපකරණ	යාන්ත්‍රික හා වෙනත් උපකරණ	පරිගණක්ජන හා විවිධ වියදම්	උපකරණ හා උපාංග	රථ වාහන	පරිගණක හා සන්නිවේදන	එකතුව
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය/වෙළඳපොල වටිනාකම											
2021 වර්ෂයේ ආරම්භක ශේෂය		**141,411,854**	**2,405,999,766**	**78,024,948**	**25,975,332**	**63,654,183**	**10,137,649**	**1,573,467**	**237,207,035**	**28,240,882**	**2,992,225,117**
එකතු කිරීම්			186,044,319	22,269,537	5,533,623	9,400,436	-	-	6,025,215	13,362,290	**242,635,420**
එකතුකිරීම්(මුදල් නොවන දෑ)											-
ඉවත් කිරීම්											-
ප්‍රත්‍යාගණන ලාභ											-
වර්ෂය තුල නුවමාරුකිරීම්											-
ඇලපුම්											-
ප්‍රාග්ධනීත නොකල වත්කම් (පෙර වර්ෂ ගැලපුම්)	10										-
2021 වර්ෂයේ අවසාන ශේෂය		**141,411,854**	**2,592,044,085**	**100,294,485**	**31,508,955**	**73,054,618**	**10,137,649**	**1,573,467**	**243,232,250**	**41,603,172**	**3,234,860,536**
											-
2022 වර්ෂයේ ආරම්භක ශේෂය		**141,411,854**	**2,592,044,085**	**100,294,485**	**31,508,955**	**73,054,618**	**10,137,649**	**1,573,467**	**243,232,250**	**41,603,172**	**3,234,860,536**
එකතු කිරීම්		225,000	626,885,107	2,666,788	-	95,990	-	-	7,965,256	1,733,600	**639,571,741**
එකතුකිරීම්(මුදල් නොවන දෑ)											-
ඉවත් කිරීම්											-
ප්‍රත්‍යාගණන ලාභ											-
වර්ෂය තුල නුවමරුකිරීම්											-
ඇලපුම්											-
ප්‍රාග්ධනීත නොකල වත්කම් (පෙර වර්ෂ ගැලපුම්)											-
2022 වර්ෂයේ අවසාන ශේෂය		**141,636,854**	**3,218,929,191**	**102,961,273**	**31,508,955**	**73,150,608**	**10,137,649**	**1,573,467**	**251,197,506**	**43,336,772**	**3,874,432,277**
සමුච්චිත ක්ෂය											
2021 වර්ෂයේ ආරම්භක ශේෂය		-	**418,383,810**	**48,144,221**	**15,515,884**	**28,448,867**	**10,133,190**	**1,573,467**	**179,542,869**	**20,122,842**	**721,865,150**
